# 9. වෙළඳාම, ගෙවුම් තුලනය සහ සංචාරක ව්‍යාපාරය

## 9.1 සමස්ත නිරීක්ෂණය

පසුගිය වසර පහ තුලම අඛණ්ඩව අතිරික්තයක්ව පැවති ශ්‍රී ලංකාවේ ගෙවුම් තුලනයේ සමස්ත ශේෂය 1995 වසරේදී, ප්‍රධාන වශයෙන් පෞද්ගලික ප්‍රාග්ධන ගලා ඒම්වල දක්නට ලැබුණ පහත වැටීම හේතුකොටගෙන විගැහි දශලක්ෂ 62 ක සමස්ත හිඟයක් බවට පත්විය. එසේ වුවද, අපනයනවල යහපත් ක්‍රියාකාරීත්වයත්, වෙළෙඳ හා ජංගම ගිණුම්වල හිඟයන් තියුණු ලෙස පහත වැටීමත් මෙම වසරේ ගෙවුම් තුලනයේ දක්නට ලැබුණු හිතකර ලක්ෂණ ලෙස සැළකිය හැක. තියුණු ලෙස පහත වැටුණු ආනයන වර්ධනයත්, අපනයනය ක්‍රියාකාරීත්වයේ වූ ප්‍රවර්ධනයත් හේතුකොටගෙන 1994 දී විගැහි දශලක්ෂ 1,089 (දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 13.3) ක් වූ වෙළෙඳ හිඟය 1995 දී විගැහි දශලක්ෂ 921 (දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 10.8) දක්වා කැපී පෙනෙන ලෙස අඩුවිය. වෙළෙඳ ගිණුමෙහි වූ මෙම යහපත් නැඹුරුවත් සමග සේවා ගිණුමෙහි වූ සුළු අතිරික්තය සහ ශුද්ධ පෞද්ගලික සංක්‍රාමයන්ගෙන් ලත් ඉපයීම් ඉහළ යාමත් නිසා ජංගම ගිණුමෙහි හිඟය 1994 දී විගැහි දශලක්ෂ 526 (ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස සියයට 6.5) සිට 1995 දී විගැහි දශලක්ෂ 358 (ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස 4.2) දක්වා පහත වැටුණි.

බොහෝ කෘෂිකාර්මික භාණ්ඩ සහ සමහර කාර්මික භාණ්ඩ සඳහා වඩා යහපත් ජාත්‍යන්තර මිළ ගණන් ලැබීම, ප්‍රධාන වැවිලි භෝග සම්බන්ධයෙන් හිතකර දේශගුණික තත්ත්වයන් පැවතීම, විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම ආදි සාධකයන්හි පිටුබලය ලත් අපනයන අංශය තුල 1995 දී

**සංඛ්‍යා සටහන 9.1**

**1991 - 1995 ගෙවුම් තුලනය - විශ්ලේෂණාත්මක ඉදිරිපත් කිරීම**


| ශීර්ෂය | විගැහි දශලක්ෂ | | | | | රුපියල් දශලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1991 | 1992 | 1993 | 1994 | 1995(අ) | 1991 | 1992 | 1993 | 1994 | 1995(අ) |
| 1. වෙළඳ භාණ්ඩ | -726 | -740 | -825 | -1,089 | -921 | -41,253 | -45,784 | -55,486 | -77,190 | -71,529 |
| අපනයන | 1,491 | 1,745 | 2,046 | 2,235 | 2,504 | 84,378 | 107,855 | 138,174 | 158,554 | 195,117 |
| ආනයන | 2,217 | 2,485 | 2,872 | 3,324 | 3,425 | 125,631 | 153,640 | 193,660 | 235,744 | 266,646 |
| 2. සේවා | -66 | -24 | 28 | 8 | 8 | -3,773 | -1,430 | 1,821 | 520 | 639 |
| ලැබීම් | 439 | 489 | 535 | 627 | 688 | 24,897 | 30,256 | 36,050 | 44,363 | 53,487 |
| ගෙවීම් | 505 | 513 | 507 | 619 | 680 | 28,670 | 31,686 | 34,229 | 43,843 | 52,848 |
| 3. භාණ්ඩ හා සේවා (1+2) | -791 | -763 | -797 | -1,081 | -913 | -45,026 | -47,214 | -53,664 | -76,671 | -70,890 |
| 4. සංක්‍රාම (ශුද්ධ) | 441 | 457 | 517 | 554 | 554 | 25,030 | 28,280 | 34,839 | 39,245 | 43,101 |
| පෞද්ගලික (ශුද්ධ) | 293 | 328 | 402 | 438 | 448 | 16,623 | 20,253 | 27,090 | 30,989 | 34,820 |
| නිල (ශුද්ධ) | 148 | 130 | 115 | 117 | 107 | 8,407 | 8,027 | 7,749 | 8,257 | 8,282 |
| 5. ජංගම ගිණුම් ශේෂය (3+4) | -350 | -306 | -280 | -526 | -358 | -19,996 | -18,935 | -18,825 | -37.425 | -27,789 |
| 6. මූල්‍ය නොවන ප්‍රාග්ධනය (ශුද්ධ) | 475 | 381 | 612 | 700 | 350 | 27,171 | 23,450 | 41,066 | 49,912 | 27,221 |
| සෘජු ආයෝජන (ශුද්ධ) | 46 | 86 | 134 | 111 | 38 | 2,633 | 5,315 | 9,107 | 7,815 | 2,931 |
| විවිධ ආයෝජන (ශුද්ධ) | 24 | 18 | 48 | 20 | -2 | 1,329 | 1,122 | 3,272 | 1,334 | -90 |
| පෞද්ගලික දිගු කාලීන (ශුද්ධ) | -18 | 18 | 135 | 216 | 52 | -1,005 | 1,162 | 8,998 | 15,628 | 4,011 |
| පෞද්ගලික දිගු කාලීන (ශුද්ධ) | 35 | 91 | 105 | 182 | 58 | 2,105 | 5,652 | 7,110 | 12,930 | 4,486 |
| රාජ්‍ය දිගු කාලීන (ශුද්ධ) | 366 | 189 | 190 | 172 | 204 | 20,849 | 11,494 | 12,579 | 12,204 | 15,883 |
| ලැබීම් | 463 | 313 | 334 | 311 | 344 | 26,378 | 19,193 | 22,317 | 22,026 | 26,779 |
| ගෙවීම් | 97 | 124 | 144 | 139 | 140 | 5,529 | 7,699 | 9,738 | 9,822 | 10,896 |
| රාජ්‍ය කෙටි කාලීන | 23 | -22 | 0 | 0 | 0 | 1,260 | -1,295 | 0 | 0 | 0 |
| 7. රුපියල් අගය පිළිබඳ ගැලපිලි | | | | | | 235 | 1,555 | -1,420 | -1,380 | 6,394 |
| 8. විගැහි වෙන් කිරීම් | | | | | | | | | | |
| 9. වැරදීම් සහ අත්හැරීම් | 27 | 59 | 44 | -1 | -54 | 2,730 | 3,398 | 3,328 | 6,059 | -4,390 |
| 10. සමස්ථ ශේෂය | 152 | 133 | 375 | 173 | -62 | 10,140 | 9,469 | 24,149 | 17,166 | 1,437 |
| 11. මූල්‍ය වෙනස්වීම් (අතිරික්තය) | -152 | -133 | -375 | -173 | 62 | -10,140 | -9,469 | -24,149 | -17,166 | -1,437 |
| විනිමය අනුපාතිකය ශ්‍රී ලංකා රුපියල් / විගැහි | | | | | | 56.61 | 61.75 | 67.39 | 70.75 | 77.74 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| වෙළෙඳ ගිණුම | | | | | | -11.07 | -10.82 | -11.10 | -13.32 | -10.80 |
| ජංගම ගිණුම | | | | | | -5.37 | -4.47 | -3.77 | -6.46 | -4.20 |
| ජංගම ගිණුම - ප්‍රදානයන් රහිතව. | | | | | | -7.62 | -6.37 | -5.32 | -7.89 | -5.45 |

මූලයන් : ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

(ආ) ගුවන්යානා පහක් ආනයනය කිරීම සඳහා පසුගිය වර්ෂවලදී ගෙවන ලද අත්තිකාරම් ගෙවීම්වල ගැලපුම් 1993, 1994 සහ 1995 ප්‍රාග්ධක ලැබීම් වලට ඇතුළත් වේ.


සටහන : මූල්‍ය අංශයේ සියළු ගනුදෙනු කාලච්ඡේදයක් අවසානයේ පැවති විනිමය අනුපාතිකය අනුව පරිවර්තනය කොට ඇත.




විගැහි වට්නාකම් අනුව සියයට 12 ක වර්ධන වේගයක් දක්නට ලැබුන අතර මෙයට අනුරූප 1994 වර්ෂයේ වර්ධනය සියයට 9 ක් විය. මේ අතර විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීමත් සමඟ කල්පවතින පරිභෝජන භාණ්ඩ ගෙන්වීම අඩුවීමත්, විදේශීය පෞද්ගලික ආයෝජන සම්බන්ධයෙන්වූ ආනයන අඩුවීමත් නිසා, 1994 දී සියයට 16 ක්වූ ආනයන වර්ධන වේගය 1995 වසරේ සියයට 3 ක් දක්වා තියුණු ලෙස අඩුවිය. ප්‍රධාන කෘෂිකාර්මික අපනයන නිෂ්පාදිත සඳහා යහපත් මිල ගණන් පැවතුනද, තිරිඟු, සීනි, කිරි නිෂ්පාදිත සහ පොහොර ආදී ප්‍රධාන ආනයන ද්‍රව්‍යයන්හි මිල ගණන් ඉහලයාම නිසා වෙළෙඳ අනුපාතය සියයට 1.3 කින් පහත වැටුණි.

තිල ප්‍රාග්ධන ගලාඒම් වර්ෂය තුලදී සියයට 19 කින් වැඩිවීම සහ සීමාසහිත ලංකා ගෑස් සමාගමේ විශාල කොටස් ප්‍රමාණයක් විකිනීමෙන් විගැහි දශලක්ෂ 25 ක් ලැබීමෙන් පසුවද, ශුද්ධ ප්‍රාග්ධන ගලාඒම් 1994 මට්ටමින් හරි අඩක් දක්වා අඩුවිය. 1994 රජය වෙනස්වීමත් සමඟ ඇතිවූ කම්කරු නොසන්සුන්තාවය සහ බෙදුම්වාදී ත්‍රස්තවාදීන් සමඟ රජය විසින් ආරම්භ කරන ලද සාම සාකච්ඡා බිඳ වැටීමෙන් පසුව දේශීය ආරක්ෂක තත්ත්වයෙහි ඇතිවූ අවිනිශ්චිතභාවය සම්බන්ධ විදේශ ආයෝජකයින්ගේ සුපරික්ෂාකාරී ආකල්පය නිසා, විදේශ සෘජු ආයෝජන 1994 මට්ටමෙන් තුනෙන් එකක් දක්වා අඩුවිය. ප්‍රධාන

**රූප සටහන 9.2**
**විදේශීය වෙළෙඳාම**



**සංඛ්‍යා සටහන 9.2**

## විදේශ වෙළෙඳාමෙහි ක්‍රියාකාරීත්වය 1991-1995

| වර්ෂය | වර්ධන අනුපාතික | | මිල දර්ශක (1990=100) | | | අනුපාතය |
|---|---|---|---|---|---|---|
| | අපනයන | ආනයන | අපනයන | ආනයන | වෙළෙඳ අනුපාතිකය(අ) | අපනයන ආනයන |
| 1991 | 3.1 | 13.0 | 105.0 | 103.9 | 101.1 | 0.65 |
| 1992 | 20.3 | 11.2 | 131.6 | 108.8 | 121.0 | 0.70 |
| 1993 | 17.1 | 15.4 | 144.7 | 114.6 | 126.3 | 0.71 |
| 1994 | 9.2 | 15.7 | 151.2 | 121.0 | 125.0 | 0.67 |
| 1995 (ආ) | 12.0 | 3.0 | 172.5 | 139.8 | 123.4 | 0.73 |

මූලයන් : ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) (අපනයන මිල දර්ශකය / ආනයන මිල දර්ශකය) X 100
(ආ) තාවකාලික

වශයෙන් එයාර් ලංකා සමාගමේ අහස් යානා ප්‍රතිසම්පාදන වැඩපිළිවෙල මූල්‍යනය කිරීම වර්ෂයේ ප්‍රථම භාගය තුල අවසන්වීම සහ ආනයනවලට අදාල කෙටිකාලීන වෙළෙඳ ණය අඩුවීම නිසා පෞද්ගලික ණය ප්‍රාග්ධන ගලාඒම් ද අඩුවිය.

ප්‍රතිපත්ති සම්බන්ධයෙන් ගත් කළ බොහෝ හිතකර වර්ධනයන් කිහිපයක් වර්ෂය තුළ දක්නට ලැබුණි. විවෘත වෙළෙඳ සහ විනිමය ක්‍රමයක් පවත්වාගෙන යාම සඳහා වූ රජයේ අඛණ්ඩ කැපවීම විදහා දක්වමින්, උපරිම ආනයන බදු අනුපාතය සියයට 45 සිට සියයට 35 දක්වා පහළ දැමීම, ආනයන බදු ක්‍රමයේ මූලික අනුපාතිකයන් 4 සිට 3 දක්වා අඩු කිරීම සහ අක්‍රමවත් ලෙස සිදු කළ ආනයන බදු නිදහස් කිරීම් ඉවත් කිරීම, ආදී පියවරයන් මගින් ආනයන බදු ව්‍යුහය තවදුරටත් විධිමත් කිරීමට පියවර ගන්නා ලදී. විනිමය අනුපාතිකය බොහෝදුරට වෙළෙඳපොල මගින් තීරණය වූ අතර එය පවත්නා මූලික සාර්ව ආර්ථික තත්ත්වයද පිළිබිඹු කළේය. ජංගම ගිණුමේ සියළුම කටයුතු, සියළුම ප්‍රාග්ධන ගලාඒම්, ණය ආපසු ගෙවීම් සහ වෙන් වෙන්ව තීරණය කල විදේශ ආයෝජන ඇතුළු අනෙකුත් සාධාරණ ප්‍රාග්ධන ගලායාම් සඳහා ද, රුපියල නිදහසේ හුවමාරු කිරීම සහතික කර ඇති නිසා විදේශ ගෙවුම් ක්‍රමයේ ක්‍රියාකාරිත්වය පැහැදිලිව පැවතුනි. මීට අමතරව, පෞද්ගලීකරණය පිළිබඳව ක්‍රියාකිරීම සඳහා පැහැදිලි කාර්යභාරයක් සහිත රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිසම වෙනම ආයතනයක් වශයෙන් පිහිටවීම මගින් විදේශ ආයෝජකයන්ගේ විශ්වාසය ගොඩනැගීමට බලාපොරොත්තු විය.

තෙවැනි පුළුල් කරන ලද ව්‍යුහාත්මක ගැලපුම් පහසුකම් යටතේ පළමු කොටස වශයෙන් 1994 දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් (ජා.මු.අ.) විගැහි දශලක්ෂ 56 ක් රටට ලැබුණි. දෙවන කොටස වූ විගැහි දශලක්ෂ 56 ජා.මු.අ. වෙතින් ලබා නොගෙනම මෙම වැඩසටහන 1995 පළමු කාර්තුවේදී අවසන් විය. විදේශ අංශයේ ඉහත සිදුවීම් නිසා 1995 දී ශ්‍රී ලංකාවේ දළ විදේශීය වත්කම් විගැහි දශලක්ෂ 63 කින් අඩුවිය. වර්ෂය අවසානයේදී පැවැති විගැහි දශලක්ෂ 1,729 ක දළ විදේශ වත්කම්, 1996 සඳහා ඇස්තමේන්තු කරන ලද ආනයනයෙන් මාස 5.4 ක ප්‍රමාණයක් මූල්‍යනය කිරීමට ප්‍රමාණවත් විය. භාණ්ඩ හා සේවා අපනයන වලින් ලත් ඉපැයීම්හි ප්‍රතිශතයක් වශයෙන් ණය සේවා ගෙවීම් ඉකුත් වර්ෂයේ වූ 13.3, 1995 වර්ෂයේදී 13.8 දක්වා වැඩිවිය.

## 9.2 අපනයන

### වැවිලි භෝග

වැවිලි භෝග වලින් ලත් අපනයන ඉපැයීම් සියයට 15 කින් වර්ධනය වූ අතර එය කෘෂිකාර්මික අපනයනයන්හි සමස්ත වර්ධනයෙන් සියයට 12 කට දායක විය. තේ අපනයන ප්‍රමාණය

**සංඛ්‍යා සටහන 9.3**

## අපනයන සංයුතිය 1991-1995

| කාණ්ඩය | විගැහි දශලක්ෂ | | | | | රුපියල් දශලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1991 | 1992 | 1993 | 1994 | 1995(අ) | 1991 | 1992 | 1993 | 1994 | 1995(අ) |
| 1. කෘෂිකාර්මික අපනයන | 469 | 429 | 469 | 490 | 546 | 26,537 | 26,504 | 31,618 | 34,692 | 42,478 |
| තේ | 316 | 241 | 295 | 296 | 317 | 17,867 | 14,893 | 19,911 | 20,964 | 24,638 |
| රබර් | 47 | 48 | 46 | 51 | 74 | 2,641 | 2,960 | 3,086 | 3,582 | 5,713 |
| පොල් | 46 | 60 | 41 | 53 | 68 | 2,619 | 3,691 | 2,796 | 3,761 | 5,271 |
| පොල් මද නිෂ්පාදන | 31 | 43 | 27 | 35 | 45 | 1,769 | 2,665 | 1,847 | 2,,476 | 3,520 |
| වෙනත් | 15 | 17 | 14 | 18 | 23 | 850 | 1,026 | 949 | 1,285 | 1,751 |
| සුළු කෘෂිකාර්මික | 60 | 80 | 87 | 90 | 88 | 3,409 | 4,959 | 5,825 | 6,385 | 6,857 |
| 2. කාර්මික අපනයන (ආ) (ඇ) | 904 | 1,251 | 1,502 | 1,672 | 1,887 | 51,188 | 77,281 | 101,437 | 118,544 | 147,095 |
| රෙදිපිළි හා ඇඟළුම් | 588 | 862 | 1,009 | 1,081 | 1,218 | 33,261 | 53,209 | 68,150 | 76,685 | 94,946 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 58 | 45 | 57 | 56 | 56 | 3,289 | 2,771 | 3,801 | 3,959 | 4,374 |
| වෙනත් | 258 | 345 | 437 | 535 | 613 | 14,638 | 21,301 | 29,486 | 37,900 | 47,774 |
| 3. ඛනිජමය අපනයන | 45 | 45 | 54 | 60 | 57 | 2,562 | 2,749 | 3,653 | 4,293 | 4,447 |
| මැණික් | 42 | 40 | 50 | 55 | 51 | 2,358 | 2,482 | 3,402 | 3,917 | 3,972 |
| වෙනත් | 4 | 4 | 4 | 5 | 6 | 204 | 267 | 251 | 375 | 475 |
| 4. වර්ග නොකළ අපනයන (ඇ) (ඈ) | 34 | 22 | 21 | 13 | 14 | 1,938 | 1,321 | 1,467 | 1,025 | 1,096 |
| මුළු අපනයන (ආ) (ඇ) | 1,452 | 1,747 | 2,046 | 2,235 | 2,504 | 82,225 | 107,855 | 138,175 | 158,554 | 195,116 |

(අ) තාවකාලික
(ආ) ගලපන ලදි
(ඇ) සංශෝධිත
(ඈ) ප්‍රතිඅපනයන ඇතුලත්ය

මූලයන් : ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ශ්‍රී ලංකා මහ බැංකුව

සියයට 5 කින්ද එහි මිල සියයට 2 කින්ද ඉහළ යාම නිසා තේ අපනයන ඉපැයීම් 1995 දී විගැහි දශලක්ෂ 317 ක් දක්වා සියයට 7 කින් ඉහළ නැගුණි. ප්‍රධාන නිෂ්පාදිත රටවල සැපයුම අඩුවීම නිසා ලෝක තේ තොග පහළ වැටීම, මුලින් පැවති සෝවියට් සමූහාණ්ඩුවේ (දැන් ස්වාධීන පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල්) වෙළෙඳපල තත්වයන් වැඩිදියුණු වීම හේතුකොටගෙන ලෝක තේ ඉල්ලුම ඉහළයාම සහ ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදිතයන්හි ගුණාත්මක තත්වය ඉහළයාම ආදී හේතුන් නිසා වසරේ දෙවන භාගය තුළ තේ මිළ ගණන්වල සැළකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණි. ස්වාධීන පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල නැගී එන වෙළෙඳපලවල් අත්පත් කර ගැනීමෙහිලා ශ්‍රී ලංකාව විසින් දරණ ලද උත්සාහයන්හි ප්‍රතිඵල විදහා දක්වමින් එම රටවලට වූ ශ්‍රී ලංකා තේ අපනයන ප්‍රමාණය කිලෝ ග්‍රෑම් දශලක්ෂ 27 කින් ඉහළ නැගුණ අතර එය 1995 වසරේ සමස්ත තේ අපනයන ප්‍රමාණයෙන් සියයට 17 කට දායක විය. මෙයට අනුරූප 1994 වසරේ වූ ප්‍රතිශතය මුළු අපනයනයන්ගෙන් සියයට 5 ක් පමණි. සාම්ප්‍රදායික තේ ගැණුම් කරුවන් වූ ස්වාධීන පොදු රාජ්‍ය මණ්ඩලයට අයත් රුසියානු සමූහාණ්ඩුව ආදී රටවලින් වූ අධික ඉල්ලුම සපුරාලීමේදී මැදපෙරදිග රටවලට වූ අපනයනයන්හි අඩුවීමක් දක්නට ලැබුණි. මීට අමතරව 1995 වසරේ සියයට 2 කින් ඉහළ ගිය දේශීය තේ නිෂ්පාදනය ද අපනයන සැපයුම වැඩි කිරිමට යම්තාක් දුරකට හේතුවිය.

රබර් අපනයන ඉපැයුම් විගැහි දශලක්ෂ 74 දක්වා සියයට 46 කින් කැපී පෙනෙන ලෙස වැඩිවීමට මුළුමනින්ම හේතුවූයේ ජාත්‍යයන්තර මිල ගණන් ඉහළ යාමය. (සියයට 47 කින්) මෙයට හේතුවූයේ මෝටර් රථ නිෂ්පාදන කර්මාන්තයේ පිබිදීම නිසා ප්‍රධාන වශයෙන්ම ජපානය හා ඇමරිකා එක්සත් ජනපදය යන කාර්මික රටවලින් වූ ඉල්ලුම යළි ඉහළයාමත්, චීනයෙන් වූ අධි ඉල්ලුමත්, මැලේසියාව වැනි ප්‍රධාන රබර් නිෂ්පාදිත රටවල රබර් සැපයුම සුළු වශයෙන් පමණක් ඉහළයාමත් ය. මීට අමතරව, සනීපාරක්ෂක අත්වැසුම් සහ බර ටයර් නිෂ්පාදිත වැනි කර්මාන්තයන්ගෙන් වර්ධනය වෙමින් පැවති ඉල්ලුමද රබර් මිල ගණන් ඉහළ යැමට හේතුවිය.

ඉහළ නැගුණ අපනයන ප්‍රමාණය හේතුකොටගෙන පොල් නිෂ්පාදිතයන්ගෙන් ලත් අපනයන ඉපැයුම් විගැහි දශලක්ෂ 68 ක් දක්වා සියයට 28 කින් වැඩිවිය. යහපත් දේශගුණික තත්වයන් නිසා දේශීය පොල් සැපයුම ඉහළ යාමත් අනිකුත් ප්‍රධාන පොල් නිෂ්පාදිත රටවලින් වූ අධි සැපයුමත් නිසා පොල් මිල ගණන් පහත වැටුණි. එසේ වුවද 1995 වසරේ අග භාගයේදී පොල් නිෂ්පාදිතයන්හි සාමාන්‍ය අපනයන මිල විගැහි වටිනාකම් අනුව සියයට 2 කින් පහත වැටුනද, එ.ජ. ඩොලර් වටිනාකම් අනුව ඉහළයාමක් පෙන්නුම් කෙරිණි.

## වෙනත් කෘෂිකාර්මික නිෂ්පාදිත

වෙනත් කෘෂිකාර්මික අපනයනයන්ගෙන් ලත් ඉපැයුම් 1994 දක්නට ලැබුණු සියයට 4 ක වැඩිවීමට ප්‍රතිවිරුද්ධව යමින් 1995 දී සියයට 2 කින් අඩුවිය. මල් හටගන්නා කාලයේ වූ වැසි සහිත දේශගුණික තත්වයන් නිසා සමහර කෘෂිකාර්මික භෝගවල දේශීය නිෂ්පාදනය පහළ වැටීමද මීට හේතුවිය. මීට අමතර වශයෙන්, අදාල නිෂ්පාදිත මූලයන්හි තොරතුරු වලට අනුව, 1995 වසරේදී ඉන්දියාවෙන් වූ තියුණු තරඟකාරීත්වය හේතුවෙන් ගර්කින් අපනයනය පසුබෑමකට ලක්විය. එළවළු අපනයන ප්‍රමාණයන් සියයට 49 කින් පහළ වැටීමට මුළුමනින්ම හේතු වූයේ ගර්කින් අපනයන ප්‍රමාණය සියයට 64 කින් පහළ යාමය. මේ අතර කෝපි සහ ගම්මිරිස් අපනයන ප්‍රමාණයන් පිළිවෙලින් සියයට 71 කින් සහ සියයට 21 කින් අඩුවිය.

## කාර්මික නිෂ්පාදිත

ප්‍රධාන ඉහළයාම් වාර්තා වූ රෙදිපිළි සහ ඇඟළුම් (සියයට 13) සහ අනිකුත් ඛණිජතෙල් නිෂ්පාදිත නොවන කාර්මික භාණ්ඩ (සියයට 15) හේතුකොටගෙන කාර්මික භාණ්ඩ අපනයනයන්ගෙන් ලත් ඉපැයීම් 1995 වසරේදී විගැහි දශලක්ෂ 1,887 ක් දක්වා සියයට 13 කින් ඉහළ නැගුණි.

රෙදිපිළි සහ ඇඟළුම්වල සාමාන්‍ය අපනයන මිල ගණන් විගැහි වටිනාකම් අනුව 1994 පැවති මට්ටමේම ස්ථාවරව පැවතුණි. සමස්ත කාර්මික අපනයනයන්ගෙන් තුනෙන් දෙකකට දායක වූ ඇඟළුම් අපනයන වැදගත්ම උප අපනයන අංශය ලෙස තවදුරටත් පැවතුණි. ඇඟළුම් අපනයන ප්‍රමාණය පමණක් සියයට 8 කින් වැඩි වූ අතර අපනයන මිල ගනන් සියයට 4 කින් ඉහළ ගියේය. මෙම වර්ධනය පංගු ක්‍රමය (Quota System) යටතේ මෙන්ම පංගු ක්‍රමයන්ගෙන් බාහිරවද වූ අපනයන වෙළෙඳපලවල් වල ක්‍රියාකාරීත්වය තුලින් පිළිබිඹු වූ අතර එයිනුත් පංගු ක්‍රමයන්ගෙන් බාහිර වෙළෙඳපල වලට යවන ලද අපනයනයන්හි කැපී පෙණෙන වර්ධනයක් දක්නට ලැබුණි. පංගු ප්‍රමාණයන්හි වාර්ෂිකව හිමිවන සාමාන්‍ය වැඩිවීම්වලට අමතරව, ඇමරිකා එක්සත් ජනපදය සම්බන්ධයෙන් වූ පංගු වර්ෂය ජූලි-ජූනි සිට ලිත් වර්ෂයක් දක්වා මාරු කිරීමත්, අඩු වශයෙන් උපයෝජනය කරනු ලබන පංගු අයිතමයන්හි ප්‍රමාණයන් පහළ දැමීම සහ වැඩි වශයෙන් උපයෝජනය කරනු ලබන ඇඟළුම් වර්ගවල පංගු ප්‍රමාණයන් ඉහළ දැමීමත් පංගු සම්බන්ධයෙන් වඩාත් නම්‍යශීලි සහ විනිවිද පෙනෙන සුළු පරිපාලනයක් පවත්වාගෙනයාමත් ඇඟළුම් අපනයන ඉහළයාමට හේතුවිය.

ඛණිජතෙල් නිෂ්පාදිතයන් අපනයනය කිරීමෙන් ලත් ඉපැයීම් පෙර වසරේ මට්ටමට (විගැහි දශලක්ෂ 56) ආසන්නයේ පැවතුණි. ඛණිජ තෙල් නිෂ්පාදිත අපනයන කාර්මික අපනයනයන්ගෙන් සියයට 3 ක් වන අතර මුළු අපනයනයන්හි ප්‍රතිශතයක් ලෙස සියයට 2 ක් පමණි. 1995 වසර මුලදී නඩත්තු කටයුතු සඳහා තෙල් පිරිපහදුව තාවකාලිකව වසා තැබීම සහ ඔක්තෝබර් මස තෙල් තොගවලට සිදු වූ ගිනි හානි හේතුකොටගෙන පිරිපහදු කරණ ලද ඛණිජ තෙල් නිෂ්පාදිත ආනයන වියදම අපේක්ෂිත ප්‍රමාණයට වඩා ඉහළ නැගුණද එය ඛණිජ තෙල් නිෂ්පාදිත අපනයනයන් කෙරෙහි බලපා නැත. ඇත්තවශයෙන්ම මිල ගණන් 1994 පැවති මට්ටමට බොහෝදුරට සමානව පැවතුණු අතර ඛණිජ තෙල් නිෂ්පාදිත අපනයන ප්‍රමාණයන්හි සුළු වැඩිවීමක් 1995 වසරේදී දක්නට ලැබුණි.

අනිකුත් ඛණිජ තෙල් නොවන කාර්මික අපනයනයන්ගෙන් ලත් ආදායම 1995 වසරේදී සියයට 15 කින් ඉහළ නැගුණ අතර, මෙම අංශයේ ඉපැයුම් මුළු කාර්මික අපනයන ඉපැයුම් වලින් සියයට 32 කට දායක විය. මෙම අපනයන කාණ්ඩයේ ඉපැයුම් ඉහළයාම් වාර්තා කළ ප්‍රධාන අංශ වූයේ සම්, රබර්, කඩදාසි, දැව සහ පිඟන් භාණ්ඩ (සියයට 17), දියමන්ති (සියයට 6), ආහාර, පාන වර්ග සහ දුම්කොළ (සියයට 8), යන්ත්‍ර සූත්‍ර, යාන්ත්‍රික හා විදුලි උපකරණ (සියයට 27) සහ ස්වර්ණාභරණ (සියයට 25) යන අපනයනයන්හිය. සාම්ප්‍රදායික නොවන අපනයනයන්ට ප්‍රදානය කරන ලද මූල්‍යමය හා ආයතනික දිරි ගැන්වීම්, විශේෂයෙන්ම අපනයන සංවර්ධන මණ්ඩලය (අ.ස.ම.) මගින් ලබාදෙන ලද දිරිගැන්වීම් මගින් මෙම අපනයනයන් තවදුරටත් දිරිගැන්විණි. මීට අමතරව, 1995

නොවැම්බර් මස සිට නොකැපූ මැණික් ගල් ආනයන සීමාවන් ඉවත් කිරීම සහ මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තය සඳහා යොදාගනු ලබන උපකරණ සහ අනිකුත් ද්‍රව්‍ය ආනයන බද්දෙන් සහ පිරිවැටුම් බද්දෙන් නිදහස් කිරීම ද දියමන්ති හා ස්වර්ණාභරණ අපනයනයන් දිරි ගැන්වීමට හේතුවිය. මෑත අතීතයේ පටන් මෙම අනිකුත් කාර්මික අපනයන කාණ්ඩය දිගින් දිගටම නවීකරණය වෙමින් පැවති අතර එය සමස්ත අපනයන පදනම විවිධාංගීකරණය කිරීමෙහිලා උපකාරී විය.

## ඛණිජ නිෂ්පාදිත

මැණික් අපනයනයන් පහත වැටීම හේතුකොටගෙන ඛණිජ නිෂ්පාදිත අපනයන ආදායම විගැහි දශලක්ෂ 57 දක්වා සියයට 5 කින් පහත වැටුණි. දේශීය නිෂ්පාදනයේ අඩුවීම හේතුවෙන් මැණික් අපනයන ප්‍රමාණයෙහි සියයට 11 ක පහත වැටීමක් දක්නට ලැබුණි. වඩා ගැඹුරු පතල් කැනීමේදී දැරීමට සිදුවන අධික වියදම සහ යන්ත්‍රෝපකරණ සහ බලශක්තිය වැනි යෙදවුම් සඳහා වූ අධික පිරිවැය හේතුකොට ගෙන පතල් කැනීමේ වියදම් ඉහළ නැගුණි. මීට අමතරව, මැඩගස්කරය වැනි ජාත්‍යන්තර මැණික් වෙළෙඳපලට මෑතකදී අවතීර්ණ වූ වඩා අඩු නිෂ්පාදිත පිරිවැය සහිත රටවල් වලින් ඇතිවූ තියුණු තරඟකාරිත්වයට මුහුණ දීමටද මැණික් අපනයන අංශයට සිදුවිය. ඛණිජ වැලි සහ මිනිරන් සඳහා වූ අධික ඉල්ලුම නිසා අනිකුත් ඛණිජ ද්‍රව්‍ය වලින් ලත් ඉපැයීම් විගැහි දශලක්ෂ 6 දක්වා සියයට 13 කින් ඉහළ නැගුණි.

## 9.3 ආනයන

### පාරිභෝගික භාණ්ඩ

ආහාර සහ පාන වර්ග ආනයනය සියයට 2 කින් ඉහළ ගිය අතර අනිකුත් පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම සියයට 3 කින් පහළ යාම නිසා සමස්ත පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම සුළු වශයෙන් පහත වැටුණි. 1995 වසරේදී වූ රුපියලේ අගය අවප්‍රමාණය වීම හේතුකොටගෙන මිල ගණන් ඉහළයාම නිසා කල්පවත්නා පාරිභෝගික භාණ්ඩ ආනයනයන්හි තියුණු පහළ යාමක් දක්නට ලැබුණි. ප්‍රධාන වශයෙන්ම පහළ වැටීම් වාර්තා වූයේ මෝටර් කාර් සහ යතුරුපැදි (සියයට 17) සහ ගුවන්විදුලි සහ රූපවාහිනී යන්ත්‍ර (සියයට 21) ආනයනයන්හිය. 1995 අයවැයෙන් පැනවූ ඩීසල් බද්දත්, රාජ්‍ය අංශය සඳහා බදු සහන යටතේ කාර් ගෙන්වීමට දී තිබූ පහසුකම අහෝසි කිරීමත් 1995 වසරේදී මෝටර් රථ වාහන ආනයන ඉල්ලුම අඩුවීමටම හේතුවිය.

ජාත්‍යන්තර මිළ ගණන් ඉහළයාම හේතුවෙන් සහල් සහ සීනි (සියයට 6 බැගින්) වියදම් අධික වීමෙන් වෙළෙඳ ගිණුමට වූ බලපෑම එම ආනයන පරිමාවන් අඩුවීම මගින් සමහන් විය. ඉහළ නැගුණු දේශීය සහල් නිෂ්පාදනයත් තොග පවත්වාගෙන යාමේ අවශ්‍යතා පහළ යාමත් ආනයන ප්‍රමාණයන් අඩුවීමට හේතුවිය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සහල් සහ සීනි සඳහා වූ ආනයන වියදම පිළිවෙලින් සියයට 83 කින් සහ 11 කින් පහත වැටුණි. ජාත්‍යන්තර මිළ ගණන් ඉහළ යාම නිසා කිරි සහ කිරි නිෂ්පාදිතයන්හි අපනයන වියදම සියයට 19 කින් ඉහළ නැගුණි.

සංඛ්‍යා සටහන 9.4

**ආනයනයන්හි අවසන් උපයෝජනය අනුව කෙරෙන වර්ගීකරණය 1991 - 1995**

| කාණ්ඩය | විගැහි දශලක්ෂ | | | | | රුපියල් දශලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1991 | 1992 | 1993 | 1994 | 1995(අ) | 1991 | 1992 | 1993 | 1994 | 1995(අ) |
| 1. පාරිභෝගික භාණ්ඩ | 572 | 521 | 555 | 648 | 646 | 32,357 | 32,197 | 37,372 | 45,985 | 50,309 |
| ආහාර සහ පාන වර්ග | 296 | 298 | 299 | 337 | 343 | 16,750 | 18,395 | 20,066 | 23,914 | 26,724 |
| සහල් | 28 | 46 | 35 | 9 | 2 | 1,589 | 2,852 | 2,386 | 655 | 122 |
| පිටි | 0 | 0 | 9 | 0 | 0 | 1 | 3 | 552 | 19 | 4 |
| සීනි | 91 | 80 | 84 | 125 | 112 | 5,138 | 4,952 | 5,621 | 8,875 | 8,716 |
| වෙනත් ආහාර | 177 | 172 | 171 | 203 | 230 | 10,020 | 10,588 | 11,507 | 14,365 | 17,882 |
| වෙනත් | 276 | 224 | 256 | 311 | 303 | 15,607 | 13,802 | 17,306 | 22,071 | 23,585 |
| 1. අන්තර් භාණ්ඩ | 1,135 | 1,337 | 1,539 | 1,689 | 1,909 | 64,265 | 82,592 | 103,952 | 119,829 | 148,624 |
| ඛණිජ තෙල් | 228 | 226 | 221 | 206 | 255 | 12,887 | 13,938 | 14,920 | 14,641 | 19,829 |
| පොහොර | 43 | 38 | 46 | 44 | 57 | 2,430 | 2,366 | 3,108 | 3,097 | 4,436 |
| රසායනික ද්‍රව්‍ය | 64 | 67 | 78 | 84 | 94 | 3,643 | 4,125 | 5,244 | 5,975 | 7,329 |
| තිරිඟු | 58 | 74 | 83 | 82 | 129 | 3,303 | 4,549 | 5,609 | 5,825 | 10,014 |
| රෙදිපිළි හා ඇඟළුම් | 364 | 543 | 617 | 723 | 763 | 20,611 | 33,552 | 41,740 | 51,299 | 59,383 |
| වෙනත් | 378 | 390 | 494 | 550 | 612 | 21,391 | 24,062 | 33,331 | 38,992 | 47,633 |
| 3. ආයෝජන භාණ්ඩ | 526 | 604 | 750 | 952 | 782 | 29,792 | 37,294 | 50,508 | 67,524 | 60,907 |
| යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 210 | 277 | 332 | 390 | 331 | 11,881 | 17,098 | 22,377 | 27,635 | 25,762 |
| ගමනා ගමන උපකරණ (ආ) | 134 | 128 | 224 | 316 | 200 | 7,607 | 7,889 | 15,012 | 22,425 | 15,562 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 121 | 129 | 138 | 168 | 179 | 6,840 | 7,936 | 9,342 | 11,898 | 13,956 |
| වෙනත් | 61 | 71 | 56 | 79 | 72 | 3,464 | 4,371 | 3,777 | 5,566 | 5,627 |
| 4. වර්ග නොකරන ලද | 4 | 24 | 26 | 32 | 83 | 229 | 1,472 | 1,718 | 2,238 | 6,479 |
| මුළු ආනයන (ඇ) | 2,237 | 2,487 | 2,870 | 3,321 | 3,421 | 126,643 | 153,555 | 193,550 | 235,576 | 266,319 |

(අ) තාවකාලික
(ආ) 1993, 1994, 1995 වර්ෂවල ආනයන කරන ලද ගුවන්යානා වටිනාකමද ඇතුලත්වේ.
(ඇ) ගලපනලදී.

මූලයන් - ශ්‍රී ලංකා රේගුව
සමූපකාර තොග වෙළඳ සංස්ථාව
ලංකා පොහොර සමාගම හා වෙනත් ප්‍රධාන පොහොර ආනයනකරුවෝ
ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව
ශ්‍රී ලංකා මහා බැංකුව

## අන්තර් භාණ්ඩ

අන්තර් භාණ්ඩ ආනයන වියදම සියයට 13 කින් ඉහළ නැගුණු අතර එහි ප්‍රධාන වැඩිවීම් වාර්තා වූයේ තිරිඟු ඇට (සියයට 57), පොහොර (සියයට 30), ඛණිජ තෙල් (සියයට 23), කඩදාසි සහ ඝන කඩදාසි (සියයට 21) ආනයනයන්හිය. ප්‍රධාන තිරිඟු පාරිභෝගික රටවලින් වර්ධනය වන ඉල්ලුමක් පවතින අතර ප්‍රධාන නිෂ්පාදිත රටවල ඓතිහාසික ලෙස වාර්තාගත අඩු නිෂ්පාදිත තත්වයක් පැවතීම සහ වසර 20 ක් තුලදී පැවති අඩුම තිරිඟු තොග තත්වයන්ද හේතුකොටගෙන ජාත්‍යන්තර මිළ ගණන් ඉහළයාම නිසා තිරිඟු ආනයන මිළ සියයට 33. කින් ඉහළ නැගුණි. 1994 වසරේ හඳුන්වා දුන් තිරිඟුපිටි සහනාධාරය නිසා වූ අධික දේශීය ඉල්ලුම හේතුකොටගෙන ආනයන ප්‍රමාණය ඉහළ යෑම, මිල ඉහළයාමේ බලපෑම් තවදුරටත් තීව්‍ර කිරීමට හේතුවිය. රෙදිපිළි සහ ඇඟළුම් අපනයනයන්හි සියයට 13 ක වර්ධනයට සාපේක්ෂව සළකන කල එම ආනයනයන් ඉහළ නැගුණේ සියයට 6 කිනි. දේශීය කැටිනූල් නිෂ්පාදනයේ ඉහළ යාමත්, අවශ්‍ය අමුද්‍රව්‍ය අවශ්‍යතා මෙතෙක් පැවති තොග මගින් සපුරා ගැනීමත් මීට හේතු විය. පොහොර ආනයන ගත්කල පොහොර සහනාධාරය යළි හඳුන්වා දීමේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවන අධි ඉල්ලුම සපුරාලීමට වැඩි පොහොර ප්‍රමාණයක් ආනයනය කළයුතු විය. මීට අමතරව චීනය, ඉන්දියාව වැනි රටවලින් පොහොර සඳහා වැඩි ඉල්ලුමක් පැවති අතර යුක්රේනයෙන් වූ පොහොර සැපයුම අඩුවීමද හේතුවෙන් ජාත්‍යන්තර පොහොර මිළ ගණන්වල ඉහළ යාමක් දක්නට ලැබුණි. නඩත්තු කටයුතු සඳහා වසර මුලදී තෙල් පිරිපහදුව වසා තැබීම නිසා බොර තෙල් ආනයන ප්‍රමාණය සියයට 2 කින් පහත වැටුණ නමුත් තෙල් සංචිත ගිනි ගැනීම නිසා සිදු වූ පාඩුව හේතුකොටගෙන පිරිපහදු කරන ලද ඛණිජ තෙල් නිෂ්පාදිත ආනයන ප්‍රමාණය වැඩිවීම නිසා ඛණිජ තෙල් ආනයන වියදම ඉහළ නැගුණි. එමෙන්ම ඛණිජ තෙල් නිෂ්පාදිතයන්හි සාමාන්‍ය ආනයන මිලද 1995 දී සියයට 3 කින් වැඩි විය. තිමැවුම් අංශයෙන් පැවතුණු අධික ඉල්ලුම නිසා අනෙකුත් සියලු අන්තර් භාණ්ඩ ආනයනයන් 1995 දී සියයට 10 කින් වැඩි විය.

සංඛ්‍යා සටහන 9.5

### 1995 වර්ෂයේ ප්‍රධාන ආනයනයන්හි පරිමාව

මෙට්‍රික් ටොන්

| මාසය | සහල් | තිරිඟු(අ) | සීනි | ඛණිජතෙල් (අ) (බොර තෙල්) | පොහොර(අ) |
|---|---|---|---|---|---|
| ජනවාරි | 7,828 | 128,472 | 45,900 | 111,051 | 88,200 |
| පෙබරවාරි | 240 | 82,056 | 26,383 | 97,169 | 44,200 |
| මාර්තු | 97 | 104,293 | 60,659 | 123,745 | 52,100 |
| අප්‍රේල් | 83 | 52,133 | 25,115 | 55,525 | 29,100 |
| මැයි | 173 | 104,160 | 37,324 | 235,982 | 45,300 |
| ජූනි | 63 | 57,073 | 13,756 | 160,880 | 22,700 |
| ජූලි | 65 | 166,370 | 14,702 | 146,073 | 13,100 |
| අගෝස්තු | 204 | 52,080 | 36,737 | 146,074 | 10,800 |
| සැප්තැම්බර් | 106 | 104,452 | 43,239 | 291,508 | 32,300 |
| ඔක්තෝම්බර් | 210 | 100,653 | 23,532 | 164,033 | 32,500 |
| නොවැම්බර් | 100 | 53,573 | 38,650 | 164,021 | 36,500 |
| දෙසැම්බර් | 287 | 52,080 | 50,912 | 164,035 | 45,600 |
| එකතුව | 9,456 | 1,057,395 | 416,909 | 1,860,096 | 452,400 |

(අ)ගලපන ලදි

මූලයන් : ශ්‍රී ලංකා රේගුව
සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව
ලංකා පොහොර සමාගම හා වෙනත් ප්‍රධාන පොහොර ආනයනකරුවෝ
ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව

## ආයෝජන භාණ්ඩ

ආයෝජන භාණ්ඩ ආනයන විගැහි දශලක්ෂ 783 දක්වා කැපී පෙනෙන ලෙස සියයට 18 කින් පහත වැටුණ අතර මෙය ප්‍රධාන වශයෙන්ම ප්‍රවාහන උපකරණ (සියයට 37), යන්ත්‍රසූත්‍ර (සියයට 15) සහ අනිකුත් ආයෝජන භාණ්ඩ (සියයට 8) ආනයන පහළ යාමේ ප්‍රතිඵලයකි. එයාර් ලංකා ආයතනයේ ගුවන්යානා ආනයනයන් ඉවත් කොට සළකා බැලූ විට ආයෝජන භාණ්ඩ ආනයනයන්හි සියයට 10 ක පහත වැටීමක් දක්නට ලැබුණි. ප්‍රවාහන උපකරණ ආනයන (ගුවන්යානා අත්හැර) වියදම සියයට 18 කින් අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පොදු ප්‍රවාහනයට යොදන රථ සහ ට්‍රැක්ටර් ආනයනයේ වූ කැපී පෙනෙන අඩුවීමය. යන්ත්‍රසූත්‍ර ආනයන කාණ්ඩයේ අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ මහන යන්ත්‍ර ගෙන්වීම පහත වැටීමය. ඉදි කිරීම් අංශයේ අඛණ්ඩව පැවති ප්‍රසාරණය පිළිබිඹු කරමින් ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයනය සියයට 7 කින් ඉහළ නැගුණි. සමස්ත ආයෝජන භාණ්ඩ ආනයන අඩුවීම දැඩි අවධානයට ලක් වියයුතු කරුණක් වන්නේ එය ආර්ථිකයේ අනාගත වර්ධන හැකියාවන්ට බාධා පමුණුවන ලෙස දේශීය ආයෝජනවල තිබුණු පහත වැටීමක් සනිටුහන් කරන බැවිනි.

## 9.4 සේවා

සේවා ලැබීම් සහ ගෙවීම් දෙකම පිළිවෙලින් විගැහි දශලක්ෂ 688 ක් සහ විගැහි දශලක්ෂ 680 ක් දක්වා සියයට 10 කින් වැඩිවීම නිසා 1995 වර්ෂය තුල සේවා ගිණුමේ ශුද්ධ විදේශ විනිමය ලැබීම් ඊට පෙර වසරේ වූ මට්ටමේම පැවතුණි. මගී ගාස්තු, ආයෝජන ආදායම් සහ වෙනත් සේවා, ලැබීම්වල වැඩිවීමට ප්‍රධාන වශයෙන් දායක වූ අතර, ගලායාම්වල වැඩිවීමද මෙම අංශ වලම දක්නට ලැබුණි. එයාර් ලංකා ආයතනයෙහි ප්‍රතිසම්පාදන වැඩපිළිවෙලින් පසුව ගමන් වාර ගණන සහ ධාරිතාව මගින් එහි කටයුතුවල ඇති වූ ව්‍යාප්තිය, මගී ගාස්තු ඉපයීම්වල වැඩිවීම මගින් පිළිබිඹු විය.

1994 වර්ෂය හා සාපේක්ෂව සංචාරකයන්ගේ පැමිණීම 1995 සැප්තැම්බර් මාසය දක්වා සමස්ත වැඩිවීමක් පෙන්නුම් කළේය. කෙසේ වුවද හතර වෙනි කාර්තුව තුල, විශේෂයෙන්ම දෙසැම්බර් මාසය තුල, සංචාරකයන්ගේ පැමිණීම කැපී පෙනෙන ලෙස අඩුවීම නිසා වර්ෂය තුල පැමිණීම් ආන්තික වශයෙන් සියයට එකකින් අඩුවිය. මීට අමතරව සංචාරකයින් විසින් මෙරට ගතකල කාලයේ සාමාන්‍ය, 1995 වර්ෂය තුල අඩුවිය. මෙම සියළුම සාධකවල ප්‍රතිඵලය වූයේ. සංචාරක කර්මාන්තයෙන් ලැබූ ඉපයීම් එ.ජ. ඩොලර් වටිනාකමින් ගත්කල සියයට 2 කින් අඩුවීමය. එසේ වුවද, විගැහි වලින් ගත්කල මීට වඩා අඩුවීමක් දැක්විය. ආදායම් මට්ටම ඉහළයාම සහ ජංගම ගිණුමට අදාළ කටයුතු සම්පූර්ණයෙන්ම නිදහස් කිරීම නිසා විදේශ සංචාර සඳහා නේවාසිකයන්ගේ ඉල්ලුම වැඩිවුන අතර එය සංචාරක ආයතන විසින් විදේශ සංචාර සඳහා ඉදිරිපත් කරන ලද විශේෂ වාරිකා සංඛ්‍යාවෙන් පිළිබිඹු විය. මෙම තත්වය මෙන්ම අධ්‍යාපනය සහ රැකියා සඳහා විදේශගත වීමට අදාළ සංචාර වැඩිවීම 1995 වර්ෂය තුල සංචාර අංශයෙහි විදේශ විනිමය පිටතට ගලායෑම් පසුගිය වර්ෂයට වඩා වැඩිවීමට හේතු විය.

සංඛ්‍යා සටහන 9.6

## 1991 - 1995 සේවා සහ සංක්‍රාම

| ශීර්ෂය | විගැහි දශලක්ෂ | | | | | රුපියල් දශලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1991 | 1992 | 1993 | 1994 | 1995(අ) | 1991 | 1992 | 1993 | 1994 | 1995(අ) |
| වරාය, ප්‍රවාහන හා රක්ෂණය | 28 | 32 | 74 | 96 | 88 | 1,588 | 1,964 | 4,944 | 6,826 | 6,802 |
| ලැබීම් | 150 | 157 | 171 | 207 | 223 | 8,497 | 9,696 | 11,509 | 14,626 | 17,352 |
| ගෙවීම් | 122 | 125 | 98 | 111 | 136 | 6,910 | 7,731 | 6,565 | 7,801 | 10,549 |
| සංචාර | 45 | 60 | 60 | 43 | 26 | 2,545 | 3,711 | 3,985 | 2,995 | 2,031 |
| ලැබීම් | 116 | 139 | 146 | 161 | 149 | 6,571 | 8,573 | 9,815 | 11,375 | 11,569 |
| ගෙවීම් | 71 | 79 | 86 | 118 | 123 | 4,026 | 4,862 | 5,831 | 8,380 | 9,539 |
| ආයෝජන ආදායම් | -130 | -127 | -88 | -117 | -91 | -7,367 | -7,821 | -5,979 | -8,310 | -7,082 |
| ලැබීම් | 40 | 48 | 79 | 100 | 140 | 2,259 | 2,997 | 5,366 | 7,111 | 10,868 |
| ගෙවීම් | 170 | 175 | 168 | 217 | 231 | 9,627 | 10,818 | 11,345 | 15,422 | 17,950 |
| ලාභ සහ ලාභාංශ | -13 | -22 | -19 | -51 | -46 | -718 | -1,391 | -1,316 | -3,666 | -3,599 |
| ලැබීම් | 2 | 1 | 4 | 1 | 1 | 89 | 84 | 279 | 33 | 54 |
| ගෙවීම් | 14 | 24 | 24 | 51 | 47 | 807 | 1,476 | 1,595 | 3,699 | 3,654 |
| පොලී | -117 | -104 | -69 | -66 | -45 | -6,649 | -6,430 | -4,662 | -4,645 | -3,483 |
| ලැබීම් | 38 | 47 | 75 | 99 | 139 | 2,170 | 2,913 | 5,087 | 7,078 | 10,814 |
| ගෙවීම් | 156 | 151 | 144 | 165 | 184 | 8,820 | 9,342 | 9,750 | 11,723 | 14,296 |
| රජයේ සේවා | -3 | -3 | -11 | -5 | -7 | -170 | -176 | -714 | -373 | -568 |
| ලැබීම් | 17 | 14 | 11 | 17 | 13 | 953 | 826 | 736 | 1,225 | 995 |
| ගෙවීම් | 20 | 16 | 22 | 23 | 20 | 1,123 | 1,001 | 1,450 | 1,598 | 1,563 |
| වෙනත් සේවා | -5 | 15 | -6 | -9 | -7 | -369 | 891 | -415 | -617 | -544 |
| ලැබීම් | 117 | 132 | 127 | 142 | 163 | 6,616 | 8,165 | 8,623 | 10,025 | 12,703 |
| ගෙවීම් | 122 | 117 | 134 | 151 | 170 | 6,985 | 7.273 | 9,038 | 10,642 | 13,247 |
| මුළු සේවා | -65 | -23 | 28 | 8 | 8 | -3,773 | -1,430 | 1,821 | 520 | 639 |
| ලැබීම් | 440 | 489 | 535 | 627 | 688 | 24,897 | 30,256 | 36,050 | 44,363 | 53,487 |
| ගෙවීම් | 505 | 513 | 507 | 619 | 680 | 28,670 | 31,686 | 34,229 | 43,843 | 52,848 |
| පෞද්ගලික සංක්‍රාම | 293 | 328 | 402 | 438 | 448 | 16,623 | 20,253 | 27,090 | 30,989 | 34,820 |
| ලැබීම් | 323 | 389 | 454 | 499 | 526 | 18,311 | 24,037 | 30,592 | 35,345 | 40,891 |
| ගෙවීම් | 30 | 61 | 52 | 61 | 78 | 1,688 | 3,784 | 3,501 | 4,357 | 6,071 |
| නිල සංක්‍රාම | 148 | 130 | 115 | 117 | 107 | 8,407 | 8,027 | 7,749 | 8,257 | 8,282 |
| ලැබීම් | 148 | 130 | 115 | 117 | 107 | 8,407 | 8,027 | 7,749 | 8,257 | 8,282 |
| ගෙවීම් | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| මුළු සංක්‍රාම | 441 | 457 | 517 | 554 | 554 | 25,030 | 28,280 | 34,839 | 39,245 | 43,101 |
| ලැබීම් | 471 | 519 | 569 | 616 | 633 | 26,718 | 32,064 | 38,341 | 43,602 | 49,173 |
| ගෙවීම් | 30 | 61 | 52 | 61 | 78 | 1,688 | 3,784 | 3,501 | 4,357 | 6,071 |

(අ) තාවකාලික


මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන : 1993 දී දත්ත එකතු කිරීමේ ක්‍රමය වෙනස් කිරීම හේතුවෙන්, සේවා ගිණුමේ විශේෂයෙන්ම 1., 4 හා 5, කාණ්ඩවල 1993 වර්ෂයෙන් පසු වර්ෂවලට අදාල දත්ත, සැසඳුවම පෙර වර්ෂ හා ගැලපිය නොහැක

රටේ විදේශ වත්කම් විගැහි දශලක්ෂ 63 කින් අඩු වුවද, වර්ෂයේ මුල් භාගය තුල පැවති ඉහළ ජාත්‍යන්තර පොලී අනුපාතිකයන් යටතේ ආයෝජනය කිරීම සහ අවශ්‍ය පරිදි මහ බැංකුවේ විදේශ ආයෝජන සංයුතියේ කරන ලද වෙනස්කම් නිසා පොලී ඉපයීම් වැඩි විය. ත්‍රස්තවාදීන් සමග පැවති නොවිසඳුනු ගැටුම් පසුබිම යටතේ, ආයෝජකයින් දැරූ සුපරීක්ෂාකාරී ආකල්පය මත පොලී සහ ලාභාංශ ශ්‍රී ලංකාවේ නැවත ආයෝජනය නොකිරීම නිසා විදේශ විනිමය පිටතට ගලායෑම් වැඩි විය.

## 9.5 සංක්‍රාම

නිල සංක්‍රාම, 1994 වර්ෂයේදී විගැහි දශලක්ෂ 117 සිට 1995 වර්ෂයේදී විගැහි දශලක්ෂ 107 දක්වා අඩුවුවද, ශුද්ධ සංක්‍රාම 1995 වර්ෂයේදී ද විගැහි දශලක්ෂ 554 ක්ව පැවතුනි. රැකියා සඳහා විදේශගත වීම නොකඩවා සිදුවීම සහ පවුල් නඩත්තුව සඳහා සාමාන්‍ය පරිදි ප්‍රේෂණ ලැබීම නිසා, පෞද්ගලික සංක්‍රාම ලැබීම් වල වර්ධනය එ.ජ. ඩොලර් වලින් සියයට 12 මට්ටමක පැවතුනි. එසේ වුවද, මෙම ලැබීම් වල වර්ධනය විගැහි වලින් පසුගිය වර්ෂයට වඩා අඩු විය.



## 9.6 ප්‍රාග්ධන සංචලන

ප්‍රාග්ධන ගිණුම තුල ශුද්ධ ගලාඒම් 1994 දී විගැහි දශලක්ෂ 700 සිට 1995 දී විගැහි දශලක්ෂ 350 දක්වා තියුණු ලෙස අඩුවිය. ප්‍රාග්ධන ගිණුමේ මෙම දුර්වල ක්‍රියාකාරීත්වය වෙළඳ ගිණුමට (ආනයන අඩුවීමක් ලෙස) සහ සමස්ත ශේෂයට මෙන්ම ආර්ථිකයට අනාගතයේ වර්ධනය වීමේ ඇති හැකියාවටද සැලකිය යුතු බලපෑමක් ඇති කරන ලදී.

### දිගුකාලීන ප්‍රාග්ධන

රජය වෙත ගලා ආ දිගුකාලීන ප්‍රාග්ධන සියයට 11 කින් වැඩි වුවද, සමහර යෝජනා ක්‍රමවලට අදාල ආධාරවල ඇති වූ ඌන උපයෝජනය නිසා එය අයවැයෙන් බලාපොරොත්තු වූ ප්‍රමාණයට වඩා තරමක් අඩුවිය. ජපානය (විගැහි දශලක්ෂ 135), ජාත්‍යන්තර සංවර්ධන සමායතනය (විගැහි දශලක්ෂ 71) සහ ආසියානු සංවර්ධන බැංකුව (විගැහි දශලක්ෂ 58) සහනදායී ආධාර ලැබීමේ ප්‍රධාන මාර්ග වශයෙන් පැවති අතර, විගැහි දශලක්ෂ 344 ක් වූ මුළු ගලාඒම් වලින් සියයට 77 ක් ඒ මගින් ලැබුණි. මෑතකදී ගිවිසගත් විදේශ ණය යටතේ ලැබීම් වැඩිවීම නිසා දළ ගලාඒම් වර්ධනය විය.


අප්‍රේල් මාසයේ සිට ආරක්ෂක තත්වයෙහි පැවති අවිනිශ්චිත බවත් කම්කරු නොසන්සුන්තාවය පිළිබඳ අත්දැකීම්ද, මෑත කාලීන යෝජිත කම්කරු ප්‍රඥප්තිය නිසා පැන නැගිය හැකි තත්වයන් පිළිබඳ පැවති අවිනිශ්චිත බවත්, අවුරුදු 17 කට පසුව රජය වෙනස්වීම නිසා ආයෝජකයන්ගේ සූපරීක්ෂාකාරී ප්‍රවේශයත් නිසා, සීමාසහිත ලංකා ගෑස් සමාගම පෞද්ගලීකරණයේ අරමුදල් ද ඇතුලුව විදේශ සෘජු ආයෝජන විගැහි දශලක්ෂ 38 දක්වා සියයට 66 කින් අඩු විය.

1995 දී එයාර් ලංකා ආයතනයෙහි අහස් යානා ප්‍රතිසම්පාදන වැඩ පිළිවෙල යටතේ පස්වැනි සහ අවසාන අහස් යානය (විගැහි දශලක්ෂ 68) ලබා ගැනීමෙන් පසුව එයට අදාළ මූල්‍ය විධිවිධාන අවසන්වීම නිසා, 1995 වර්ෂය තුල ලැබුන පෞද්ගලික දිගුකාලීන ණය ඊට පෙර වර්ෂ දෙක තුල ලැබුණ ප්‍රමාණයට වඩා අඩු විය. මුදල් ප්‍රවාහයන්හි නොගැලපීම් සහ සම්පත් ආශ්‍රිත ගැටළු නිසා, දිගුකාලීන ණය දීමේ කටයුතු කරගෙන යාමට හැකිවනු පිණිස, 1995 අග භාගයේදී සංවර්ධන මූල්‍ය ආයතන දෙක එ.ජ. ඩොලර් දශලක්ෂ 57 ක් විදේශ වලින් ලබා ගත්තේය. කෙසේ වුවද, මෙම මුදලින් එ.ජ.ඩොලර් දශලක්ෂ 14 ක් පමණක් 1995 වර්ෂය තුල මුදා හැරිණි. නිෂ්පාදන ධාරිතාවයන් වැඩි කිරීම වෙනුවට පවත්නා ධාරිතාව උපයෝජනය කිරීමේ ආයෝජකයන්ගේ ආකල්පයද දිගුකාලීන ණය ප්‍රාග්ධන ගලාඒම් අඩුවීමට හේතුවිය. මේ අතර, විදේශ මුදල් බැංකු ඒකක වලින් ආයෝජන මණ්ඩලය යටතට ගැනෙන ව්‍යවසායන් සඳහා දෙන ලද ණය, අවුරුද්ද තුලදී විගැහි දශලක්ෂ 35 කින් කැපී පෙනෙන ලෙස වැඩි වූ බවට ඇස්තමේන්තු කෙරුන අතර එය ආර්ථික ක්‍රියාවලියන් පවත්වාගෙන යාමට සහ නව ආයෝජන සඳහා ද තරමක් දුරට ආධාර විය.

### කෙටිකාලීන ප්‍රාග්ධන

පෞද්ගලික අංශයේ ශුද්ධ කෙටිකාලීන ප්‍රාග්ධන ගලාඒම්, 1994 දී විගැහි දශලක්ෂ 182 සිට 1995 දී විගැහි දශලක්ෂ 58 දක්වා පහත වැටුනි. ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව

රූප සටහන 9.4
විදේශීය වත්කම් (ත්‍රෛමාසිකව)




සංඛ්‍යා සටහන 9.7

**1991 - 1995 ශ්‍රී ලංකාවේ විදේශීය වත්කම්**

| ශීර්ෂය | විගැහි දශලක්ෂ (අ) 1991 | 1992 | 1993 | 1994 | 1995 | රුපියල් දශලක්ෂ 1991 | 1992 | 1993 | 1994 | 1995 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. රජය (ආ) | 27 | 23 | 23 | 16 | 12 | 1632 | 1482 | 1597 | 1132 | 938 |
| 2. රාජ්‍ය නියෝජිතත්ව | - | ... | .... | ... | - | 1 | 1 | 1 | - | - |
| 3. මහ බැංකුව (ඇ) | 476 | 658 | 1,194 | 1,373 | 1,375 | 28,957 | 41,592 | 81,404 | 99,859 | 110,521 |
| 4. වෙළෙඳ බැංකු | 306 | 366 | 326 | 403 | 341 | 18,633 | 23,161 | 22,256 | 29,349 | 27,446 |
| 5 එකතුව | 809 | 1,047 | 1,544 | 1,792 | 1,729 | 49,223 | 66,236 | 105,258 | 130,340 | 138,905 |
| 6. දළ විදේශීය සම්පත් මගින් කළ හැකි ආනයන - මාස ගණන | | | | | | | | | | |
| 6.1 වෙළෙඳ භාණ්ඩ | 4.4 | 5.1 | 6.5 | 6.5 | 6.1 | | | | | |
| 6.2 භාණ්ඩ හා සේවා | 3.6 | 4.2 | 5.5 | 5.5 | 5.1 | | | | | |

(අ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග එකඟවන ලද නියෝජන අනුපාතිකයට අනුව පරිවර්තනය කරන ලද මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතයේ සමහර ශීර්ෂයන් හැර ඉතිරිය පහත සඳහන් කාලපරිච්ඡේද අවසානයේ වූ විනිමය අනුපාතිකයන්ට අනුව පරිවර්තනය කර ඇත.

| වර්ෂය | 1991 | 1992 | 1993 | 1994 | 1995 |
|---|---|---|---|---|---|
| විගැහි 1 කට රුපියල් | 60.85 | 63.33 | 68.19 | 72.76 | 80.39 |


මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(ආ) භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් නමින් ඇති ගිණුමේ හර ශේෂයන් ඇතුලත් කිරීම සඳහා 1985 සිට සංඛ්‍යා සංශෝධනය කර ඇත.

(ඇ) වාණිජ බැංකු විසින් මහ බැංකුවේ තැන්පත් කර ඇති, විදේශ මුදල් ගිණුම් වලට අදාල විදේශ මුදල් සංචිත ඇතුලත් කිරීම සඳහා 1993 සිට සංඛ්‍යා සංශෝධනය කර ඇත.

1995 දී ආනයන ණය වෙනුවෙන් විගැහි දශලක්ෂ 10 ක ශුද්ධ ආපසු ගෙවීමක් කරන ලදී. කෙටිකාලීන වෙළෙඳ ණය ප්‍රමාණයෙහි සමස්ත අඩුවීම, නව ආයෝජනයන්හි අඩුවීම් සහ අපනයන වර්ධන වේගයට සාපේක්ෂව අඩු වර්ධන වේගයක් පෙන්වූ; භාණ්ඩ ආනයනයෙන් පිළිබිඹු විය. නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය තොග ගබඩා කර තබා ගැනීමෙන් දැරීමට වන ඉහළ ආවස්ථික පිරිවැය අඩුකර ගැනීම පිණිස, පවතින තොග, නිෂ්පාදනය සඳහා අඩු වීමට ඉඩ සලසා, කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා වෙළෙඳ ණය උපයෝගී කර ගැනීම අවම කරන ලදී. මේ අතර, කෙටිකාලීන ප්‍රාග්ධන ගලායෑම් වැඩිවීමට මුල් වෙමින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ පවතින ව්‍යවසායයන් විසින් තම විදේශීය බැංකු ශේෂ වැඩිකර ගන්නා ලදී. රට තුල ආයෝජන වාතාවරණය යහපත් අයුරින් පැවැතියේ නම් මෙම අරමුදල් වලින් කොටසක් නැවත ආයෝජනය කිරීමට මෙම ව්‍යවසායකයින් පෙළඹීමට ඉඩ තිබිණි.

කොළඹ කොටස් වෙළෙඳපොලේ ආයෝජනයන් වසර



රූප සටහන 9.5
විදේශීය ණය

සංඛ්‍යා සටහන 9.8

**1991 - 1995 විනිමය අනුපාතික වෙනස්වීම්**

| මුදල් වර්ගය | වර්ෂය අගදී පැවති අනුපාතක (ඒකකයට රුපියල්) | | | | | පෙර වර්ෂයට වඩා ප්‍රතිශත වෙනස් වීම් (අ) | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1991 | 1992 | 1993 | 1994 | 1995 | 1991 | 1992 | 1993 | 1994 | 1995 |
| ජර්මන් මාර්ක් | 28.0178 | 28.5714 | 28.7371 | 32.1622 | 37.7638 | -6.65 | -1.94 | -0.58 | -10.65 | -14.83 |
| ප්‍රංශ ප්‍රැන්ක් | 8.1924 | 8.3857 | 8.4655 | 9.3151 | 11.0493 | -5.86 | -2.31 | -0.94 | -9.12 | -15.70 |
| ඉන්දියන් රුපියල් | 1.6352 | 1.7520 | 1.5774 | 1.5926 | 1.5448 | 36..57 | -6.67 | 11.07 | -0.95 | 3.09 |
| ජපන් යෙන් | 0.3390 | 0.3699 | 0.4433 | 0.5004 | 0.5255 | -13.19 | -8.35 | -16.56 | -11.41 | -4.78 |
| බ්‍රිතාන්‍ය පවුම් | 79.5820 | 69.4278 | 73.4972 | 78.0513 | 84.2465 | -5.02 | 14.63 | -5.54 | -5.83 | -7.35 |
| එ. ජ. ඩොලර් | 42.5800 | 46.0000 | 49.5615 | 49.9800 | 54.0475 | -5.50 | -7.43 | -7.19 | -0.84 | -7.53 |
| විශේෂ ගැණුම් හිමිකම් | 60.8464 | 63.3337 | 68.1932 | 72..7604 | 80.3875 | -5.91 | -3.93 | -7.13 | -6.28 | -9.49 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) වෙනස්වීම් ගණන් බලා ඇත්තේ ශ්‍රී ලංකා රුපියලට අදාල විදේශීය ව්‍යවහාර මුදල් වටිනාකම් පදනම් කරගෙනය.

සටහන : සෘණ ලකුණින් ශ්‍රී ලංකා රුපියලෙහි අගය අඩුවීම පෙන්නුම් කරයි.

තුලදී පහළ මට්ටමක පැවතුණි. එසේ වුවද 1995 ජූනි සහ නොවැම්බර් මාස අතර හිතකර වර්ධනයක් දක්නට ලැබුන අතර, විගැහි දශලක්ෂ 9 ක් පමණ වූ ශුද්ධ විදේශ ප්‍රාග්ධන ගලාඒම් වර්ෂයේ පළමු මාස පහ තුල සිදු වූ ශුද්ධ විදේශ ප්‍රාග්ධන ගලායෑම් සමනය කිරීමට සමත් විය. ලොවෙහි මූල්‍ය සහ විදේශ මුදල් වෙළෙඳපොලවලද අස්ථාවර භාවයක් ඇති කල මෙක්සිකානු අර්බුදයට පසුව, විදේශ ආයෝජකයින් බොහෝ දුරට ශ්‍රී ලංකාව වැනි නැගී එන වෙළෙඳපොලකට වඩා ස්ථාවරභාවයට පත්වූ වෙළෙඳපොලවල් කෙරෙහි නැඹුරු විණි.

## 9.7 විදේශීය වත්කම්

ශ්‍රී ලංකාවේ දල විදේශ වත්කම් 1994 අවසානයේ විගැහි දශලක්ෂ 1,792 සිට 1995 අවසානයේ විගැහි දශලක්ෂ 1,729 දක්වා සියයට 4 ක අඩුවීමක් පෙන්නුම් කරයි. වාණිජ බැංකුවල විදේශීය වත්කම් 1995 දී විගැහි දශලක්ෂ 341 දක්වා විගැහි දශලක්ෂ 62 කින් අඩුවීම තුලින් මෙය පිළිබිඹු විය. ශ්‍රී ලංකා මහ බැංකුව සහ රජය සතු විදේශීය වත්කම් වලින් සමන්විත දළ නිල සංචිත වර්ෂ දෙක අතරදී විගැහි දශලක්ෂ 1,389 සිට විගැහි දශලක්ෂ 1,387 දක්වා සුළු වශයෙන් අඩු විය. 1995 වර්ෂය අවසානයේදී පැවති දල විදේශීය වත්කම් 1996 සඳහා ඇස්තමේන්තු කරන ලද මාස 5.4 ක ආනයන මූල්‍යනය කිරීමට ප්‍රමාණවත් වූ අතර දළ නිල සංචිත ප්‍රමාණය මාස 4.3 ආනයන මූල්‍යනය කිරීම සඳහා ප්‍රමාණවත් විය.

## 9.8 විනිමය අනුපාතික සංචලනයන්

ජාත්‍යන්තර මුදල් වෙළෙඳ පොළෙහි ප්‍රධාන විදේශීය ව්‍යවහාර මුදල් අතර විනිමය අනුපාතිකයන්හි දැඩි උච්චාවචනයන් මධ්‍යයේ ශ්‍රී ලංකා රුපියලේ අගය, මැදිහත්වීම සඳහා භාවිතා කරන එ.ජ. ඩොලරයට ප්‍රතිමුඛව සියයට 7.5 කින් සහ විගැහිවලට ප්‍රතිමුඛව සියයට 9.5 කින් 1994 දෙසැම්බර් සහ 1995 දෙසැම්බර් අතර කාලය තුලදී අවප්‍රමාණය විය. ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන්ට සහ තරඟකරුවන්ට සාපේක්ෂව සංයුක්ත නාමික සඵල විනිමය අනුපාතිකය මෙම කාලය තුලදී සියයට 8 කින් අවප්‍රමාණය වීම සහ මූර්ත සඵල විනිමය අනුපාතිකය සියයට 3 කින් අවප්‍රමාණය වීම, 1995 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ තරඟකාරීත්ව දර්ශකයේ දක්නට ලැබුණු යහපත් වර්ධනයකි.

## සඵල විනිමය අනුපාතිකය

**විශේෂ සටහන 5**


විදේශීය මුදල් සඳහා වන විනිමය අනුපාතිකය දෙයාකාරයකින් ප්‍රකාශ කළ හැක. එනම් විදේශ මුදල් ඒකකයක් සඳහා වන දේශීය මුදල් ප්‍රමාණය (price quotation system) හෝ දේශීය මුදල් ඒකකයක් සඳහා වන විදේශීය මුදල් ප්‍රමාණය (volume quotation system) යන ලෙසින්ය. සාමාන්‍යයෙන් විනිමය අනුපාතික ප්‍රකාශ කරනුයේ පළමු ක්‍රමයට වුවත් දෙවන ක්‍රමයට විනිමය අනුපාතික ප්‍රකාශ කිරීම දේශීය මුදලේ අවප්‍රමාණය හෝ ප්‍රතිප්‍රමාණය තක්සේරු කිරීමට භාවිතාකල හැකි ඉතා යෝග්‍ය දර්ශකයකි1 උදාහරණයක් ලෙස, ඇමරිකානු ඩොලරයට ප්‍රතිමුඛව වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතිකය 1994 වසරේ රුපියල් 49.42 ක් වූ අතර එය 1995 වසරේදී රුපියල් 51.25 ක් දක්වා වෙනස් වූ අතර, ඒ හේතුවෙන් රුපියලක ඇමරිකානු ඩොලර් වටිනාකම එ.ජ. ශත 2.02 සිට එ.ජ. ශත 1.95 දක්වා පහත වැටුණි. ඒ අනුව, නාමික වශයෙන් ඇමරිකානු ඩොලරයට එරෙහිව රුපියලේ සාමාන්‍ය නාමික විනිමය අනුපාතිකය, 1995 වසරේදී සියයට 4 කින් අවප්‍රමාණය විය.

විනිමය අනුපාතිකයේ වෙනස්වීම් මැන බැලීම සඳහා බහුල ලෙස භාවිතා වන අනෙකුත් දර්ශක වන්නේ නාමික සඵල විනිමය අනුපාතිකය සහ මූර්ත සඵල විනිමය අනුපාතිකයන්ය.[2]

නාමික සඵල විනිමය අනුපාතිකය ප්‍රධාන ද්විපාර්ශ්වික නාමික විනිමය අනුපාතිකයන්ගේ බර තබන ලද සාමාන්‍යයකි. මෙම බර තැබීමට සඵල විනිමය අනුපාතික පැසට අයත් ප්‍රධාන වෙළෙඳ හවුල්කරුවන්ගේ ව්‍යවහාර මුදල්වල සාපේක්ෂ වැදගත්කම පිළිබිඹු කරන වෙළෙඳ පංගු පදනම් වේ[3]. මූර්ත සඵල විනිමය අනුපාතිකය ලබා ගන්නේ නාමික සඵල විනිමය අනුපාතිකය, පැසට අදාල ව්‍යවහාර මුදල් අයත්වන රටවල උද්ධමන වෙනස්වීම් වලට අනුකූලව ගැලපීමෙනි. අදාල රටවල උද්ධමන අනුපාතය, ඒ ඒ රටවල දේශීය නිෂ්පාදන වියදම් ප්‍රවනතා ප්‍රොක්සි ලෙස නිරූපනය කරන බැවින්, මූර්ත සඵල විනිමය අනුපාතිකය විදේශ වෙළඳපොළෙහි දේශීය නිෂ්පාදනවල තරඟකාරිත්වය පෙන්නුම් කරනු ඇතැයි අදහස් කෙරේ. එසේ වුවද මූර්ත සඵල විනිමය අනුපාතිකය පමණක් තරඟකාරිත්වයේ වෙනස්කම් තිරණය කිරීම සඳහා දර්ශකයක් ලෙස යොදා නොගත යුත්තේ එය අනෙකුත් සාධක සමූහයක බලපෑම් ප්‍රමාණවත් ලෙස ග්‍රහණය නොකරන බැවිනි. මෙම සාධකවලට සාර්ව ආර්ථික ප්‍රතිපත්ති වෙනස්වීම සහ ආයතනික හා පාලන ක්‍රමයන්හි මෙන්ම ඵලදායිතාවයේ වෙනස්වීම් ඇතුලත් වෙළඳාම හා විනිමය ක්‍රමයේ වෙනස්වීම් අයත් වේ. මෙයට අමතරව මිල දර්ශකවලට අදාල දත්ත පිළිබඳ දුර්වලතාද තිබිය හැක.

එසේ වුවද, සඵල විනිමය අනුපාතික දර්ශක, තරඟකාරිත්වය අගය කිරීම සඳහා පුළුල් වශයෙන් භාවිතා කෙරේ. නාමික සඵල විනිමය අනුපාතිකය සහ මූර්ත සඵල විනිමය අනුපාතිකය ප්‍රධාන වශයෙන් සැලකිල්ලට ගන්නේ වෙළෙඳ ශේෂයයි. එනම් විදේශීය විනිමය අනුපාතිකයේ වෙනස්වීම් මත සිදුවන වෙළෙඳ ප්‍රවාහ වෙනස්වීම්ය. මූර්ත සඵල විනිමය අනුපාතිකය ප්‍රතිප්‍රමාණය වීමේ නැමියාව අපනයන වර්ධනයට සහ ආනයන සමග තරඟකරන දේශීය කර්මාන්තවල වර්ධනයට අහිතකර යයි සලකනු ලැබේ.

රූප සටහන 1
**නාමික සඵල විනිමය අනුපාතිකය**
**(1990 = 100)**




---

1. බ්‍රිතාන්‍ය භාවිතා කරනුයේ volume quotation system වන අතර ස්ටර්ලිං පවුම සඳහා විනිමය අනුපාතිකය සාමාන්‍යයෙන් ප්‍රකාශ කරනුයේ ස්ටර්ලිං පවුමක් සඳහා වන විදේශ මුදල් ප්‍රමාණය වශයෙනි.
2. හර්ෂ් සහ හිගින්ස් විසින් 1970 ඉදිරිපත් කළ නාමික සඵල විනිමය අනුපාතිකය නම් වූ සංකල්පය පසුව තවත් අය විසින් තවදුරටත් වැඩි දියුණු කරන ලදී. මේ පිළිබඳව වැඩි විස්තර ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් ප්‍රකාශිත අංක WP/87/87 දරණ වැඩ පත්‍රිකාවෙන් (A Revised Weighting Scheme for indicators of Real Effective Exchange Rate) ලබා ගත හැක.
3. නාමික විනිමය අනුපාතිකය (NER)
   $E_{SL,i}$ = i වන රටේ මුදලින් ශ්‍රී ලංකාවේ රුපියලක් සඳහා වන නාමික විනිමය අනුපාතිකය
   නාමික සඵල විනිමය අනුපාතිකය (NEER)

$NEER = \prod_{i=1}^{J} (E_{SL})^{w_i}$

i රට සඳහා $W_i$ බර තබන ලද නාමික විනිමය අනුපාතිකයන්ගේ ගුණෝත්තර සාමාන්‍යය.

මූර්ත සඵල විනිමය අනුපාතිකය (REER)

$REER = \prod_{i=1}^{J} (E_{SL,i} \cdot P_{SL}/P_i)^{w_i}$

i රටේ සහ ශ්‍රී ලංකාවේ උද්ධමන වේග අනුපාතය සලකා බලන i රට සඳහා $w_i$ බර තබන ලද නාමික විනිමය අනුපාතිකයන්ගේ ගුණෝත්තර සාමාන්‍යය.


සාමාන්‍යයෙන් නා.ස.වි.අ. සහ මූ.ස.වි.අ. දර්ශක ගණනය කරනු ලබන්නේ ද්විපාර්ශවික විනිමය අනුපාතික දර්ශක උපයෝගී කරගෙනයි. මෙම දර්ශකයන්හි පහත වැටීම අවප්‍රමාණය වීමක් පෙන්නුම් කරයි.

### විශේෂ සටහන 5 (සම්බන්ධයි)

1990 පාද වර්ෂය ලෙස සලකා, ශ්‍රී ලංකාවේ වෙළඳ හවුල්කරුවන් සහ තරඟකරුවන් 24 කගේ දත්ත උපයෝගී කරගෙන ලබාගත්, නාමික සඵල විනිමය අනුපාතිකය 1995 වසර අවසානයේ 78.2 වූ අතර එය පසුගිය වසර පහ තුළ සියයට 22 කින් අවප්‍රමාණය වීමක් පෙන්නුම් කරයි. මෙය ශ්‍රී ලංකාවේ වෙළඳ හවුල්කරුවන් සහ තරඟකරුවන්ගේ ව්‍යවහාර මුදල් හා සලකන විට, ශ්‍රී ලංකා රුපියලේ නාමික අගය සීඝ්‍ර ලෙස අවප්‍රමාණය වීමක් පිළිබිඹු කරයි. නාමික සඵල විනිමය අනුපාතිකයේ වෙනස්වීම්වලට අමතරව, දේශීය හා විදේශීය උද්ධමන වේගයන්හි සිදුවූ වෙනස්වීම්වල බලපෑම නිසා, මූර්ත සඵල විනිමය අනුපාතිකය, 1990-95 කාලය තුළදී පාද වර්ෂයේ දර්ශකයවූ 100 ට සාපේක්ෂව සියයට-3 සිට සියයට +13 අතර පරාසයක උච්චාවචනය විය.

1995 වසරේදී ශ්‍රී ලංකාවේ වාර්ෂික උද්ධමන වේගය වූ සියයට 11.5 (ලක්ෂිත සදනම)සමඟ සසඳන විට, අදාල රටවල් 24 හි ඒකාබද්ධ උද්ධමන වේගය සියයට 5.5 ක් විය. ශ්‍රී ලංකාවේ සාපේක්ෂව ඉහළ උද්ධමන වේගයක් පැවතුනත්, නාමික සඵල විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම හේතුවෙන් මූර්ත සඵල විනිමය අනුපාතිකය 1995 වසරේදී සියයට 3.1 කින් අවප්‍රමාණය විය.

රූප සටහන 2
මූර්ත සඵල විනිමය අනුපාතිකය
(1990 = 100)




සංඛ්‍යා සටහන 9.9

## 1991 - 1995 නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය

| ශීර්ෂය | විගැහි දශලක්ෂ | | | | | රුපියල් දශලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1991 | 1992 | 1993 | 1994 | 1995(අ) | 1991 | 1992 | 1993 | 1994 | 1995(අ) |
| 1. මැදි හා දිගු කාලීන ණය | 4246 | 4,624 | 5,060 | 5,384 | 5,695 | 255,798 | 289,679 | 345,083 | 391,714 | 442,425 |
| රජයේ | 3,589 | 3,841 | 4,123 | 4,214 | 4,507 | 218,400 | 243,251 | 281,142 | 306,615 | 350,425 |
| රජයේ ඇප සහිත රාජ්‍ය සංස්ථා | 141 | 176 | 246 | 349 | 370 | 8,578 | 11,121 | 16,804 | 25,414 | 28,751 |
| රජයේ ඇප සහිත පෞද්. අංශය | 120 | 129 | 144 | 159 | 157 | 7,319 | 8,173 | 9,821 | 11,576 | 12,229 |
| රජයේ ඇප රහිත රාජ්‍ය සංස්ථා | 3 | 2 | 1 | 1 | 1 | 197 | 151 | 97 | 95 | 93 |
| රජයේ ඇප රහිත පෞද්. අංශයේ | 113 | 139 | 170 | 237 | 259 | 6,867 | 8,784 | 11,566 | 17,281 | 19,824 |
| ජා.මූ.අ.න් කළ ගැණුම් | 280 | 338 | 376 | 422 | 400 | 14,437 | 18,199 | 25,653 | 30,734 | 31,104 |
| 2. කෙටි කාලීන ණය | 350 | 421 | 526 | 707 | 765 | 20,200 | 24,579 | 31,689 | 44,619 | 59,479 |
| රජය | 21 | 0 | 0 | 0 | 0 | 1,275 | 0 | 0 | 0 | 0 |
| මහ බැංකුවේ ණය ගැනීම් | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| අනෙකුත් (ආ) | 329 | 421 | 526 | 707 | 765 | 18,925 | 24,579 | 31,689 | 44,619 | 59,479 |
| 3. මුළු ණය (1+ 2) | 4596 | 5,045 | 5,586 | 6,091 | 6,460 | 275,998 | 314,257 | 376,772 | 436,333 | 501,904 |
| විශේෂිත අයිතමයන් | | | | | | | | | | |
| මැදි හා දිගුකාලීන ණය | | | | | | | | | | |
| (1). ව්‍යාපෘති ණය | 2,393 | 2,556 | 2,711 | 2,891 | 3,103 | 145,631 | 161,873 | 184,859 | 210,354 | 241,238 |
| (2). ව්‍යාපෘති නොවන ණය | 1,177 | 1,251 | 1,305 | 1,239 | 1,262 | 71,600 | 79,234 | 88,984 | 90,147 | 98,131 |
| (3) සැපයුම් කරුවන්ගේ ණය | 30 | 61 | 119 | 111 | 114 | 1,805 | 3,873 | 8,087 | 8,051 | 8,876 |
| (4) ජා.මූ. අ ණය | 280 | 338 | 376 | 422 | 400 | 14,437 | 18,199 | 25,653 | 30,734 | 31,104 |
| (5). අනෙකුත් ණය (ඇ) | 366 | 418 | 550 | 721 | 816 | 22,325 | 26,499 | 37,500 | 52,429 | 63,075 |

(අ) තාවකාලික
(ආ) ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රතිග්‍රහණ ණය, වෙළෙඳ ණය සහ විදේශීය ව්‍යවහාර මුදල් බැංකු හිමින්ගෙන් ලබාගත් කෙටිකාලීන ණය ඇතුලත් වේ.
(ඇ) රාජ්‍ය සංස්ථා සහ පෞද්ගලික අංශය මගින් ගත් ණය ඇතුළුව දිගුකාලීන ණය.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

සංඛ්‍යා සටහන 9.10

1991 - 1995 ණය සේවා ගෙවීම්

| ශීර්ෂය | විගැහි දශලක්ෂ | | | | | රුපියල් දශලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1991 | 1992 | 1993 | 1994 | 1995(අ) | 1991 | 1992 | 1993 | 1994 | 1995 (අ) |
| 1. ණය සේවා ගෙවීම් | 356 | 382 | 357 | 379 | 441 | 20,173 | 23,671 | 24,066 | 26,734 | 34,161 |
| ණය ආපසු ගෙවීම් | 201 | 231 | 213 | 214 | 257 | 11,353 | 14,329 | 14,317 | 15,012 | 19,865 |
| ජා.මූ. අරමුදලට | 64 | 54 | 18 | 9 | 22 | 3,600 | 3,359 | 1,119 | 616 | 1,650 |
| අනෙකුත් | 137 | 177 | 195 | 205 | 234 | 7,753 | 10,969 | 13,198 | 14,396 | 18,214 |
| පොළී ගෙවීම් | 156 | 151 | 144 | 165 | 184 | 8,820 | 9,342 | 9,750 | 11,723 | 14,296 |
| ජා.මූ. අරමුදලට | 15 | 8 | 5 | 5 | 5 | 830 | 481 | 363 | 348 | 407 |
| අනෙකුත් | 141 | 144 | 139 | 160 | 179 | 7,990 | 8,862 | 9,387 | 11,374 | 13,889 |
| 2. වෙළෙඳ භාණ්ඩ අපනයන හා සේවාවන්ගේ ඉපැයීම් | 1,930 | 2,234 | 2,581 | 2,862 | 3,192 | 109,275 | 138,111 | 174,224 | 202,917 | 248,603 |
| 3. වෙළෙඳ භාණ්ඩ අපනයන, සේවා හා පෞද්ගලික සංක්‍රාම | 2,253 | 2,623 | 3,035 | 3,361 | 3,718 | 127,586 | 162,148 | 204,815 | 238,262 | 289,495 |
| 4. ණය සෙවා අනුපාතිත (ආ) | | | | | | | | | | |
| 2 හි ප්‍රතිශතයන් වශයෙන් | | | | | | | | | | |
| සමස්ත අනුපාතිකය | 18.5 | 17.1 | 13.8 | 13.3 | 13.8 | 18.5 | 17.1 | 13.8 | 13.2 | 13.7 |
| ජා.මූ. අරමුදලේ ගනුදෙනු හැර | 14.4 | 14.3 | 12.9 | 12.8 | 12.9 | 14.4 | 14.4 | 12.9 | 12.7 | 12.9 |
| 3 හි ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| සමස්ත අනුපාතිකය | 15.8 | 14.6 | 11.8 | 11.3 | 11.8 | 15.8 | 14.6 | 11.8 | 11.2 | 11.8 |
| ජා.මූ. අරමුදලේ ගනුදෙනු හැර | 12.3 | 12.2 | 11.0 | 10.9 | 11.1 | 12.3 | 12.2 | 11.0 | 10.8 | 11.1 |
| 5. රජයේ ණය සේවා ගෙවීම් | | | | | | | | | | |
| 1 හි කොටසක් වශයෙන් (ඇ) | 178.0 | 205.9 | 221.6 | 233.4 | 240.7 | 10,075.0 | 12,713.0 | 14,933.5 | 15,833.3 | 18,712.0 |
| 1 හි ප්‍රතිශතයක් වශයෙන් | 50.0 | 53.9 | 62.0 | 61.5 | 54.6 | 49.9 | 51.0 | 62.1 | 59.2 | 54.8 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

(ආ) වර්ෂය තුළ විනිමය අනුපාතිකයන්හි සිදුවූ වෙනස්වීම් හේතුවෙන්, රුපියල් වටිනාකම හා විගැහි වටිනාකම අනුව වෙන් වෙන් වශයෙන් ගණනය කරන ලද ණය සේවා අනුපාතිකයන් වෙනස් වේ.

(ඇ) ජා.මූ. අරමුදලෙහි ගණුදෙනු හැර.

## 9.9 විදේශීය ණය

විගැහි දශලක්ෂ 369 ක වැඩිවීමක් වාර්තා කරමින් 1995 වර්ෂය අවසානය වනවිට ශ්‍රී ලංකාවේ විදේශීය ණය ප්‍රමාණය විගැහි දශලක්ෂ 6,460 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. මෙම වැඩිවීම, වැඩිවශයෙන්ම ජපානය සහ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය මගින් ප්‍රදානය කරන ලද සහනදායි ආධාර වලින් සමන්විත රජයේ මැදි සහ දිගුකාලීන ණය තුලින් බෙහෙවින්ම පිළිබිඹු විය. මේ අතර නොගෙවා ඉතිරි වූ රජය විසින් සහතික කරන ලද රාජ්‍ය සංස්ථා ණය, විගැහි දශලක්ෂ 370 දක්වා වැඩි වූ අතර, එයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ එයාර් ලංකා අහස් යානා ප්‍රතිසම්පාදන වැඩපිළිවෙල යටතේ අවසාන වාරිකය වශයෙන් ලබාගත් ණය මුදලයි. 1995 වර්ෂයේදී රජය සහතික කල නව ණය පෞද්ගලික අංශය විසින් ලබාගෙන නැත. රජයේ සහතික කිරීමක් නොමැති පෞද්ගලික අංශය විසින් ලබාගත් ණය වලින් නොගෙවා ඉතිරි වූ ණය ප්‍රමාණය විගැහි දශලක්ෂ 237 සිට විගැහි දශලක්ෂ 259 දක්වා ඉහළ යාමට සම්පූර්ණයෙන්ම හේතු වූයේ විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක වලින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ඇති ව්‍යවසායයන්ට ලබා දුන් ණයයි. විගැහි දශලක්ෂ 22 ක ආපසු ගෙවීම සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් මෙම වසර තුල වෙනත් ණය නොගැනීම හේතුවෙන්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට නොගෙවා ඉතිරිව ඇති මුළු ණය ප්‍රමාණය 1995 වර්ෂාවසානයේදී විගැහි දශලක්ෂ 400 දක්වා අඩු විය.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රතිග්‍රහණ ණය, ආයෝජන මණ්ඩලය යටතේ සහ ආයෝජන මණ්ඩලය යටතේ නොවන ව්‍යවසායයන් ලබාගත් ආනයන සම්බන්ධ වෙළඳ ණය සහ ආයෝජන මණ්ඩලයේ ව්‍යවසායයන් විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකවලින් ලබාගත් ණය වලට පමණක් කෙටිකාලීන ණය සම්භාරය සීමා විය. නොගෙවා ඉතිරිව ඇති මෙවැනි ණය ගැනීම් 1994 සහ 1995 වසර දෙක ඇතුලත විගැහි දශලක්ෂ 58 කින් වැඩි විය.

## 9.10 ණය සේවා ගෙවීම්

මැදි හා දිගුකාලීන ණය ආපසු ගෙවීම් හා සියලුම විදේශ ණය වෙනුවෙන් කරන ලද පොළී ගෙවීම් අඩංගු ණය සේවා ගෙවීම්, 1995 වර්ෂයේදී විගැහි දශලක්ෂ 441 දක්වා සියයට 16කින් වැඩි විය. ණය ආපසු ගෙවීම් සහ පොළී ගෙවීම් යන දෙකම පිළිවෙලින් විගැහි දශලක්ෂ 43 ක් සහ විගැහි දශලක්ෂ 19 කින් වැඩිවිය. ජා.මූ. අරමුදලේ ණය ආපසු ගෙවීම් වැඩිවීමට හේතු වූයේ 1989 වර්ෂයේ ලබා ගන්නා ලද ව්‍යුහාත්මක ගැලපුම් පහසුකම් (Structural Adjustment Facility ) යටතේ වූ ණය ආපසු ගෙවීම් ආරම්භ වීමයි. අනිකුත් ණය ආපසු ගෙවීම් විගැහි දශලක්ෂ 29 කින් වැඩි විය. මෙම වර්ෂය තුලදී අපනයන වර්ධනය සියයට 12 ක්ව තිබියදී, ණය සේවා අනුපාතය 1994 වර්ෂයේ සියයට 13.3 සිට 1995 වර්ෂයේදී සියයට 13.8 දක්වා ඉහළයාම පෙන්නුම් කරන්නේ, අපනයන වර්ධනයට වඩා වැඩි වේගයකින් ණය සේවා ගෙවීම් වැඩිවීමයි. ණය

සේවා ගෙවීම්, භාණ්ඩ හා සේවා අපනයනය සහ පෞද්ගලික සංක්‍රාම්වල අනුපාතිකයක් වශයෙන් ගත්කල එය වර්ෂ දෙක තුලදී සියයට 11.3 සිට සියයට 11.8 දක්වා වැඩි විය.

## 9.11 විදේශීය අංශයට අදාල ප්‍රතිපත්ති

### විනිමය අනුපාතිකය

මූර්ත සඵල විනිමය අනුපාතිකය ඇතුළු ආර්ථික සහ මූල්‍ය දර්ශක රාශියක මෑත කාලීන ප්‍රවනතා සලකා බලා, ශ්‍රී ලංකා මහ බැංකුව මැදිහත්වීම් සඳහා භාවිතා කරන ඇමරිකානු ඩොලරයේ දෛනික ගැණුම් හා විකුණුම් මිල සියයට දෙකක පරාසයක් සහිතව ප්‍රකාශයට පත් කරන ලද අතර, මෙම අනුපාතික දෙක තුල ශ්‍රී ලංකා රුපියල් සඳහා එ.ජ. ඩොලර් මිලදීගැනීමට හෝ විකිණීමට සූදානම්ව සිටින ලදී. වාණිජ බැංකු වලට තම තමන්ගේ ගැණුම් සහ විකුණුම් මිල ගණන් ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය නම්‍යශීලිතාවය මෙම පුළුල් පරාසය මගින් ලබා දෙන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රකාශයට පත් කරන ලද ඇමරිකානු ඩොලරයේ ගැණුම් හා විකුණුම් මිල ආශ්‍රිතව වෙළෙඳපොලේ විනිමය අනුපාතිකයේ හැසිරීම, කෙටිකාලීන විනිමය වෙළෙඳපොලේ පවතින තත්වය පෙන්නුම් කරන දර්ශකයක් විය.

ඉතා කෙටි කාලපරිච්ඡේදයන් කිහිපයකදී විනිමය අනුපාතිකය අවප්‍රමාණය වේ යැයි පැවති සැක සහිත බලාපොරොත්තු නිසා වෙළෙඳපොල විනිමය අනුපාතිකය අවප්‍රමාණය නොවන්නට 1995 වසරේ වැඩි කාලයක් තුල වෙළෙඳපොල විනිමය අනුපාතිකය ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ප්‍රකාශිත ගැණුම් මිලට ඉතා ආසන්නව පැවතිණි.

### ආනයන සහ අපනයන පාලන

ඉතා සුළු සුවිශේෂතා කිපයක් හැරුණු කොට ශ්‍රී ලංකාව පෙර පරිදිම විවෘත වෙළෙඳ ප්‍රතිපත්ති පවත්වාගෙන යන ලදී. පරිසර සංරක්ෂණ සහ කෞතුක භාණ්ඩ සුරක්ෂිතව පවත්වා ගැනීමේ හේතුන් මත අපනයන වර්ග සතරක් බලපත්‍ර ක්‍රමය යටතේ තබනු ලැබිය. ඒවා නම් කොරල් සිප්පි සහ කටු, දැව සහ දැව උපකරණ, ඇත් දල සහ ඇත් දල නිෂ්පාදිත සහ 1945 ට පෙර ලියාපදිංචිය සහිත මගී ප්‍රවාහන රථ ආදියයි. තවදුරටත් ආනයන බලපත්‍ර ක්‍රමය යටතේ යම් ආනයන පාලනයක් පවත්වාගෙන යනු ලැබුයේ ප්‍රධාන වශයෙන්ම පොදු සෞඛ්‍යය, පොදු ආචාරධර්ම, පරිසර සංරක්ෂණය සහ ජාතික ආරක්ෂාව ආදී හේතුන් මත ය. තිරිඟු, මෙස්ලින්, තිරිඟු සහ මෙස්ලින් පිටි යන ආනයන හතර සඳහා ආනයන බලපත්‍ර අවශ්‍යතා පවත්වාගෙන යනු ලැබුයේ රජය සහ පෞද්ගලික අංශයේ පිටි නිෂ්පාදිත සමාගමක් අතර පැවති පෙර එකඟ වූ ගිවිසුමකට අනුවය. දේශීය නිෂ්පාදකයන්ට ආරක්ෂණයක් සැපයීමේ අරමුණින් අර්තාපල්, ළූණු, වියලි මිරිස්, ඉරිඟු යන කෘෂිකාර්මික නිෂ්පාදිතයන් ආනයන බලපත්‍ර ක්‍රමය යටතේ තවදුරටත් පවත්වාගනු ලැබිය.

### රෙදි පිළි අපනයන පංගු ප්‍රමාණයන් වෙන්කිරීම

සුදුසු අපනයන කරුවන්ගේ නිෂ්පාදන වලට අඛණ්ඩව රෙදිපිළි අපනයන පංගු ලබාදීම සඳහා, රෙදිපිළි අපනයන පංගු වෙන්කිරීම ඔවුන්ගේ අතීත අපනයන ක්‍රියාකාරිත්වය මත මූලිකවම පදනම් විය. මූලික වෙන්කිරීමෙන් පසුව, ඉතිරියෙන් සියයට 2 ක්, කුඩා රෙදි පිළි පංගු හිමි අතිකුත් ලියාපදිංචි අපනයන කරුවන්ට (අපනයන පංගු නොමැති හෝ ඉකුත් වසරේ රෙදිපිළි දුසිම් 5,000 ට වඩා අඩු ප්‍රමාණයක් අපනයන කළ), එම ආයතන වල සිටින සේවක සංඛ්‍යාව සලකා බලා ලබාදිණි. ඉතිරි පංගු ප්‍රමාණය සංචිතයට එකතුකොට ඒවා අතිකුත් අපනයන කරුවන් අතර බෙදා දෙන ලද්දේ, ඔවුන්ගේ සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවා නියුක්තියන්ගේ භාර අරමුදලට කරන ලද ගෙවීම් සලකා බැලීමෙනි. මෙම සංචිත පංගු ක්‍රමය කුඩා පංගු හිමියන්ට සහ කර්මාන්තයට පිවිසි නවකයන්ට අවස්ථාව ලබාදුන් අතර පංගු වෙන්කිරීම මෙන්ම උපයෝජනය සතුටුදායක කිරීමට හේතු විය.

### විදේශීය වෙළෙඳාම මත වූ ආනයන බදු සහ අතිකුත් බදු

ක්‍රියාත්මකව පැවතෙන ආනයන බදු සංශෝධන යටතේ, ආනයන බදු ක්‍රමය විධිමත් කිරීමේ ක්‍රියාවලිය 1995 වසර තුලද තවදුරටත් ඉදිරියට ගෙන යන ලදී. 1993 වසරේ නොවැම්බර් මස සිට ක්‍රියාත්මකව පැවති සියයට 45, 35, 20 සහ 10 යන බදු අනුපාත සහිත අනුපාත කාණ්ඩ හතරක් යටතේ පැවති ආනයන බදු ව්‍යුහය, 1995 පෙබරවාරි මස සිට සියයට 35, 20 සහ 10 යන අනුපාතයන්ගෙන් යුතු අනුපාත කාණ්ඩ තුනක් සහිත බදු ක්‍රමයක් බවට පරිවර්තනය කරන ලදී. එසේ වුවද සුළු ප්‍රමාණයක් වූ ආනයන අංශ සමහරක් නව බදු ක්‍රමයෙන් බාහිරව තවදුරටත් පැවතුණි. ඒවා නම් දුම්කොළ, මත්පැන්, ඛණිජ තෙල් සහ සමහර කාණ්ඩ වලට අයත් මෝටර් රථ වාහන ආනයනයන්ය.

අවිධිමත් ලෙස ප්‍රදානය කරණ ලද බොහෝ බදු නිදහස් කිරීම් සහ බදු සහන 1995 අයවැය මගින් ඉවත්කොට, ආනයන බදු ක්‍රමය තවදුරටත් සරල කරණ ලදී. 1995 වසරේ දෙවන භාගයේදී ඉතා පැහැදිලි ලෙස නිර්වචනය කරන ලද අරමුණුවලට පමණක් සීමා වන පරිදි, බදු නිදහස් කිරීම් බොහොමයක් සැලකිය යුතු ලෙස අඩුකර ගැනීමට හැකි විය. 1996 අයවැය මගින්, සමහර කෘෂිකාර්මික කටයුතු, මුද්‍රණ කර්මාන්තය, ධීවර කටයුතු, දැව නිෂ්පාදිත, සිනමා කර්මාන්තය ආදි අංශ සඳහා කරනු ලබන ආනයන සඳහා වූ බදු අඩු කරන ලදී. උදළු, මුල්ලු වැනි කෘෂි උපකරණ, මුද්‍රණ සහ ලියන කඩදාසි සහ අභ්‍යාස පොත් සඳහා වූ ආනයන බදු සියයට 35 සිට සියයට 10 දක්වා අඩු කරන ලදී. මාළු දැල් ආනයන බදු සියයට 35 සිට සියයට 20 දක්වා අඩු කරන ලදී. ආනයන බදු නිදහස් කිරීම් ලබා දුන් ආනයන වූයේ ධීවර බෝට්ටු නිෂ්පාදනය කිරීම සඳහා පාවිච්චි කරන එන්ජින්, ෆයිබර් ග්ලාස් සහ අතිකුත් යෙදවුම්, කොටන් සහ ඉරන ලද ස්වරූපයන්ගෙන් යුත් දැව, දේශීය සිනමා කර්මාන්තය සඳහා ගෙන්වනු ලබන දල සේයා පට, සිනමා කැමරා සහ සිනමා ප්‍රක්ෂේපණ යන්ත්‍ර, තිර සහ වෙනත් අමතර කොටස් ආදියයි.

මැණික් සහ ස්වර්ණාභරණ අපනයන වර්ධනය කිරීමේ අරමුණින්, ඒ සඳහා ගෙන්වනු ලබන අමුද්‍රව්‍ය (උදා– මැණික් ගල්, රත්රන් සහ අතිකුත් උපාංග) මෙන්ම මැණික් කැපීම සහ පිළියෙල කිරීම සඳහා භාවිතා කරනු ලබන උපකරණ සහ යන්ත්‍රසූත්‍ර ආනයන බද්දෙන් නිදහස් කරන ලදී. මීට අමතරව, අපනයන නිෂ්පාදිත සඳහා වූ ආනයන සඳහා පිරිනමන ලද ජාතික ආරක්ෂක බදු නිදහස, එම අංශය මගින් කරනු ලබන පරිභෝජන භාණ්ඩ ආනයනයන්ද ආවරණය වන පරිදි පුළුල් කරන ලදී.

## ශ්‍රී ලංකාවේ තිරුබදු ප්‍රතිසංවිධාන

**විශේෂ සටහන් 6**

1977 ට පෙර වකවානුවේ අනුගමනය කරන ලද අභ්‍යන්තරාභිමුඛ සංවර්ධන උපාය මාර්ගයට අනුව හැඩගැසුණු ශ්‍රී ලංකාවේ වෙළෙඳ ප්‍රතිපත්තිය දැඩි විෂමතාවන්ගෙන් යුත් එකක් විය. ගෙවුම් ශේෂ හේතූන් මත මෙන්ම, දේශීය ආර්ථික කටයුතු සහ බොහෝදුරට රාජ්‍ය ආයතනයන් වූ කාර්මික ව්‍යවසායයන්ට ආනයන ආරක්ෂණය සැපයීම ද අරමුණු කරගෙන තිරුබදු මෙන්ම තිරු බදු නොවන බාධක දැඩි ලෙස යොදාගනිමින් ආනයන පාලනය කරන ලදි. එකල පැවති තිරුබදු ව්‍යුහය, සියයට 10 සිට සියයට 500 අතර විහිදී පැවති විවිධ බදු අනුපාත රැසකින් යුක්ත වූ අතර, 19 කට ආසන්න ප්‍රධාන බදු අනුපාත මට්ටම් වලින් යුතු විය. මෙම සීමාකරණයන්ගෙන් යුත් වෙළෙඳ ප්‍රතිපත්ති මගින් සමස්ථ ආර්ථික වර්ධනය සහ සමාජ සුභසාධනය සම්බන්ධයෙන් දැඩි අහිතකර ප්‍රතිවිපාක ඇති කරන ලදි. ඉතා ඉහළ තිරු බදු සහ තිරු බදු නොවන සීමාකරණ හේතුකොටගෙන ජාත්‍යන්තර වෙළෙඳපලට ඉදිරිපත් කරනු ලබන භාණ්ඩ සහ දේශීය භාණ්ඩ අතර සාපේක්ෂ මිල ගණන් වල දැඩි විෂමතා ඇති වූ අතර එය සම්පත් උපයෝජනයේ කාර්යක්ෂමතාව කෙරෙහි අහිතකර ප්‍රතිවිපාක ඇති කරන ලදි. විෂමතාවන්ගෙන් යුත් වෙළෙඳ ප්‍රතිපත්ති මගින් හිමිකර දුන් අධිකතර ආරක්ෂණය මගින් අකාර්යක්ෂම ආනයන ආදේශන කර්මාන්ත දිරි ගැන්විණි. මේ අතර, දැඩි ලෙස ප්‍රතිප්‍රමාණය වූ විනිමය අනුපාතිකය, ආනයන යෙදවුම් හිඟය, දේශීය වශයෙන් නිෂ්පාදිත අමුද්‍රව්‍යවල අධික මිල, ඉහළ අපනයන බදු සහ රාජ්‍ය නිලධාරිවාදය තුළ ක්‍රියාත්මක වූ සීමාකරණවලින් යුත් පාලන ක්‍රමය යන කරුණු හේතුකොටගෙන අපනයන වර්ධනයට බාධා සිදුවිය.

1970 දශකයේ අගදී, විවෘත ආර්ථික ප්‍රතිපත්ති පදනමක් වෙතට යොමු වූ ආර්ථික ප්‍රතිසංස්කරණ මාලාවක් ක්‍රියාත්මක කිරීමට පියවර ගැනීමත් සමඟම, වෙළෙඳ නිර්බාධකරණය වෙතට පළමු පියවර තැබිණි. එසේවුවද, ප්‍රධාන තිරුබදු ප්‍රතිසංවිධානයන් ක්‍රියාත්මක කිරීම 1980 දශකයේ අග දක්වා ප්‍රමාද විය. මෑතදී සිදුකල තිරුබදු ප්‍රතිසංවිධානයන්හිදී මූලික අවධානය යොමු වූයේ, තිරුබදු ව්‍යුහය වඩාත් විධිමත් කිරීම හා සරල කිරීම, ඉහළ තිරුබදු අනුපාත පහළ දැමීම, ප්‍රමාණාත්මක පාලන ක්‍රම ඉවත් කිරීම සහ නිදහස් කිරීම් අඩු කිරීම ආදිය සඳහාය. මෙම ප්‍රතිසංවිධානයන්, අතිකුත් සීමාකරණ ඉවත් කිරීමේ ක්‍රියාපිළිවෙත්, එනම් විනිමය පාලන ක්‍රම ලිහිල් කිරීම සහ ආර්ථික කටයුතු සම්බන්ධයෙන් වූ රාජ්‍ය ඒකාධිකාරය බැහැර කිරීම සමග ඒකාබද්ධව ක්‍රියාත්මක කරන ලදි.

තිරුබදු අනුපාත කාණ්ඩ සංඛ්‍යාව දැඩි ලෙස බෙදී පැවතුණු ව්‍යුහයක සිට, ක්‍රමානුකූල ක්‍රියාවලියක් තුළින් ප්‍රධාන බදු අනුපාත 13 ක් දක්වා අඩු කිරීමට 1990 වන විට හැකිවිය. 1991 දී, සියයට 10, 20, 35 සහ 50 වශයෙන් වූ තිරුබදු අනුපාත කාණ්ඩ හතරකින් යුත් ක්‍රමයක් ලෙසට තිරුබදු ව්‍යුහය තවදුරටත් විධිමත් කරන ලදි. මෙම ක්‍රමය මගින්, රේගු දත්ත ලේඛණ අංකිත ක්‍රමයේ දශමාංශක සතරක මට්ටමක් දක්වා වර්ගීකරණය කරන ලද තිරුබදු අනුපාතිකයන්ගෙන් දළ වශයෙන් සියයට 97ක්ම ආවරණය කරන ලද අතර අනුපාත මට්ටම් හතරේ බදු ක්‍රමයට බාහිරව පැවති භාණ්ඩ වර්ගවල සංඛ්‍යාව සියයට තුනක් පමණ දක්වා අඩු කරන ලදි. යම් විශේෂිත තිරුබදු, සියයට සියයත් වූ වටිනාකම් මත අය කරනු ලබන බදු අනුපාත බවට පරිවර්තනය කිරීම මගින් 1993 අප්‍රේල් මස සිට තිරුබදු ක්‍රමය තුළ පැවති විෂමතා තවදුරටත් අඩුකිරීමට පියවර ගත් අතර මෙම බද්දේ උපරිම අනුපාතිකය 1993 නොවැම්බර් සිට සියයට 50 ක් දක්වා අඩු කරන ලදි. එමෙන්ම, මෝටර් රථවාහන සම්මත බදු අනුපාත කාණ්ඩ යටතට ගෙන ඒමත් සමඟම බදු ක්‍රමය ප්‍රතිසංවිධානය කිරීමේ තවත් ඉදිරි පියවරක් සනිටුහන් විය. මෝටර් රථවාහන තිරුබදු පහත හෙලන ලද අතර, එන්ජින් ධාරිතාව මත තීරණය කරන ලද විවිධ බදු අනුපාත සියයට 50 ත් සියයට 100 ත් අතර පරාසයක් තුළ පවත්වාගනු ලැබිය.

**සංඛ්‍යා සටහන 1**

**ආනයන බදු එකතු කිරීමේ ඵලදායී අනුපාතය (අ)**

ප්‍රතිශතය

| අයිතමය | 1994 | 1995 |
|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | 20.06 | 12.91 |
| ආහාර හා පාන වර්ග | 22.66 | 13.88 |
| සහල් | 35.17 | 38.50 |
| පිටි | 0.04 | 0.12 |
| සීනි | 19.65 | 14.55 |
| කිරි හා කිරි නිෂ්පාදන | 14.52 | 11.47 |
| මාළු වියලන ලද | 5.16 | 1.95 |
| වෙනත් මාළු නිෂ්පාදන | 5.50 | 4.62 |
| වෙනත් ආහාර | 37.44 | 18.72 |
| **ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ** | 17.25 | 11.62 |
| මෝටර්රථ සහ සයිකල් | 24.09 | 21.70 |
| ගුවන්විදුලි යන්ත්‍ර හා රූපවාහිනී යන්ත්‍ර | 6.08 | 6.87 |
| රබර් ටයර් හා ටියුබ් | 41.44 | 33.63 |
| බෙහෙත් සහ ඖෂධීය නිෂ්පාදන | 1.35 | 1.47 |
| වෙනත් | 18.19 | 11.06 |
| **අන්තර් භාණ්ඩ** | 7.95 | 9.10 |
| පොහොර | 0.05 | 0.02 |
| ඛනිජ තෙල් | 42.95 | 44.47 |
| අතිකුත් ඛනිජ නිෂ්පාදන | 18.66 | 23.43 |
| රසායනික ද්‍රව්‍ය හා සංයෝග | 8.25 | 9.76 |
| ඩයි වර්ග, පදම් කිරීමේ හා වර්ණ ද්‍රව්‍ය | 9.64 | 8.79 |
| කඩදාසි සහ ඝන කඩදාසි | 10.14 | 9.81 |
| රෙදිපිළි | 0.93 | 1.00 |
| අතිකුත් අන්තර් භාණ්ඩ | 8.45 | 9.23 |
| **ආයෝජන භාණ්ඩ** | 9.63 | 10.08 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 10.81 | 8.67 |
| ගමනාගමන උපකරණ | 14.62 | 21.58 |
| යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 6.02 | 6.20 |
| වෙනත් | 15.00 | 10.13 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව


(අ) අයකරගත් තිරු බදු ආනයන වටිනාකමේ ප්‍රතිශතයක් වශයෙන්.

මෙවැනි ප්‍රගතියක් අත්කරගත්තද විනිවිද නොපෙනෙන සුළු සමාජ සහ දේශපාලනික හේතූන් මත ක්‍රියාත්මක වූ බදු නිදහස් කිරීම් අත්හැරීම්, විශේෂිත බදු පැනවීම්, අමතර ගාස්තු සහ ගෙවීම් නියම කිරීම් ආදිය නිසා, බදු ව්‍යුහය තුළ තවදුරටත් කැපී පෙනෙන විෂමතා දක්නට ලැබුණි.

1995 අයවැය මගින් තිරුබදු ක්‍රමය ප්‍රතිසංවිධානය කිරීමේ වැඩපිළිවෙලේ සැලකිය යුතු වර්ධනයක් ඇති කරන ලදි. පහළ මට්ටමක ඒකීය තිරුබද්දක් ඇති කිරීමේ අවසන්

### විශේෂ සටහන 6 (සම්බන්ධයි)

අරමුණු ඉටු කර ගැනීම සඳහා තවදුරටත් සමීප වෙමින්, 1995 පෙබරවාරි මස සිට තීරුබදු ක්‍රමයේ උපරිම අනුපාතය පහත හෙළමින්, සියයට 10, 20 සහ 35 ක් වූ බදු අනුපාත කාණ්ඩ තුනකින් යුත් බදු ව්‍යුහයක් ඇති කරන ලදී. එසේ වුවද, බදු ආදායම් ලබා ගැනීම සහ සමාජමය හේතූන් මත මත්පැන්, දුම්කොළ, බොරතෙල් සහ සමහර කාන්ඩවල මෝටර් රථ ඉහල තීරුබදු අනුපාතයන්ට යටත්ව පැවතුණි. මීට අමතරව, තීරුබදු ව්‍යුහය වඩාත් සරල හා විනිවිද පෙනෙන සුළු බවට පත් කිරීම සඳහා ඉතිරිව තිබූ සමහරක් තීරුබදු සහන සහ තීරුබදුවලින් නිදහස් කිරීම් ඉවත් කිරීම හෝ යලි සකස් කිරීම නව තීරුබදු ව්‍යුහය යටතේ සිදු කරන ලදී. මෙම ප්‍රතිසංවිධිත නව තීරුබදු ව්‍යුහය මගින් දේශීය කර්මාන්ත සඳහා වූ ආරක්ෂණය අඩු කරන ලද අතර, ඒ මගින් වඩා කාර්යක්ෂම ලෙස සහ ජාත්‍යන්තර වෙළෙඳපොලේ වඩාත් තරඟකාරී ලෙස කටයුතු කිරීම සඳහා එම අංශ දිරිමත් කරන ලදී.




1995 වසර තුලදීද අපනයන අංශය වටිනාකම මත පනවන බදු සහ අතිකූත් බදු වලින් නිදහස්ව පැවතුණ අතර සමහර අපනයන සඳහා පමණක් සෙස් බද්ද සහ රාජ්‍ය භාර අය කිරීම් තවදුරටත් ක්‍රියාත්මකව පැවතුණි. ඉහළ නැගුණ ජාත්‍යන්තර රබර් මිල ගණන් හමුවේ රබර් සෙස් බද්ද පලමුව කිලෝග්‍රෑමයකට රු 2.21 සිට කිලෝග්‍රෑමයකට රු. 4.91 දක්වා 1995 පෙබරවාරි මසදී ද, පසුව කිලෝග්‍රෑමයකට රු. 5.41 දක්වා 1995 ජූලි මාසයේදී ද, ඉහළ දමන ලදී.

## නැව් ගාස්තු

නැව් සමාගම් අතර වැඩි වූ තරඟකාරීත්වය හේතුකොටගෙන නාවික සේවාවන්හි කාර්යක්ෂමතාව, 1995 වසර තුල තවදුරටත් වැඩි දියුණුවිය. නාවික කටයුතු වලදී වඩා අඩු වියදම් සහිත ක්‍රමයක් වූ Non Vessel Operating Common Carriers (NVOCCs) ක්‍රමය භාවිතයට පැමිණීමේ හේතුවෙන්, මෙම වසර තුල නාවික ගාස්තු තවදුරටත් පහත වැටුණි. මහා බ්‍රිතාන්‍ය, උතුරු අර්ධද්වීපය, ඊජිප්තුව, සිරියාව ආදි ප්‍රධාන වෙළෙඳ මධ්‍යස්ථාන සඳහා සිය සේවාවන් සපයනු ලබන නැව් සේවාවන් සිය නාවික ගාස්තු ව්‍යුහය, වෙළෙඳ ද්‍රව්‍ය මත පදනම් වූ ක්‍රමයක සිට සියල්ල එක්ව ගත් පොදු ක්‍රමයක් (Freight of All Kinds - FAK) වෙතට වෙනස් කරණු ලැබූ අතර, මධ්‍යධරණී කලාපය, සිංගප්පූරුව සහ ප්‍රංශය වෙතට වූ නාවික සේවාවන් සිය ගාස්තු ව්‍යුහය මීට පෙර පොදු ක්‍රමය (FAK) යටතේ සකස් කරගෙන තිබුණි. මෙම නව ක්‍රමය හඳුන්වා දීම හේතුකොටගෙන මහා බ්‍රිතාන්‍යය සහ උත්තර අර්ධ ද්වීපය වෙතට කරනු ලබන තේ, කපාපු පොල් සහ ඇඟළුම් අපනයන සඳහා වූ නැව් ගාස්තු සියයට 6 කින්ද, රබර්, රබර් අත්වැසුම්, සක්‍රීය කළ කාබන්, කොසු සහ බුරුසු අපනයන සඳහා වූ නැව් ගාස්තු සියයට 12 කින් ද පහත වැටුණි. මධ්‍යධරණී කලාපය සහ ප්‍රංශය වෙතට වූ සියලු වෙළඳ ද්‍රව්‍ය අපනයන සඳහා වූ නැව් ගාස්තු සියයට 5 බැගින් පහළ ගිය අතර සිංගප්පූරුව වෙතට වූ නැව් ගාස්තු නොවෙනස්ව පැවතුණි. ඇමරිකා එක්සත් ජනපදය, නැගෙනහිර කැනඩාව සහ ජපානය වෙතට වූ තේ සහ ඇඟළුම් අපනයන සඳහා වූ නැව් ගාස්තුද පහත වැටුණු අතර මැද පෙරදිග රටවල් වෙතට වූ නැව් ගාස්තු නොවෙනස්ව පැවතුණි.

## අපනයනකරුවන් සඳහා දිරිගැන්වීම්

අපනයන සංවර්ධන මණ්ඩලය (අ.ස.ම.) විසින් අපනයන අංශය වෙතට මූල්‍යමය සහ ආයතනික දිරිගැන්වීම් මෙම වසර තුලද නොකඩවා ලබාදුණි. තීරු බදු ප්‍රතිදාන ක්‍රමය (Duty Rebate Scheme), බන්ධිත ගුදම් ක්‍රමය (Manufacture - in - Bond Scheme), තීරුබදු සහ අනෙකුත් බදුවලින් නිදහස්ව ප්‍රාග්ධන හා අතරමැදි භාණ්ඩ අපනයනය කිරීමේ ක්‍රමය (Duty Free Clearance of Machinary Scheme) 1995 වසර තුලද ක්‍රියාත්මක විය. සම්ප්‍රදායික නොවන අංශයේ සුළු පරිමාණ මෙන්ම මහා පරිමාණ අපනයනකරුවන්ට මූල්‍ය පහසුකම් සැපයීමද 1995 වර්ෂය තුළ තවදුරටත් සිදු කරණ ලදී. මීට අමතරව අපනයන ක්‍රියාපටිපාටි, ඇලෙවිකරණය, ඇසුරුම්කරණය සහ තාක්ෂණික වැඩිදියුණු කිරීම් මගින් භාණ්ඩ නිෂ්පාදිතයන්හි තත්වය උසස් කිරීම ආදි කරුණු පිළිබඳව ආපනයනකරුවන් දැනුවත් කිරීම සඳහා දේශීය සහ විදේශීය සම්මන්ත්‍රණ සහ වැඩමුළු සංවිධානය කිරීම වැනි පුළුල් පරාසයක් තුළ පැතිරගිය අතිකූත් සේවාවන් රැසක් අ.ස.ම. මගින් ලබාදෙන ලදී. 1994 වසරේදී හඳුන්වාදෙනු ලැබූ සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායයන් සඳහා වූ ආධාර වැඩපිළිවෙල වඩාත් ව්‍යාප්ත වූ ක්‍රියාකාරීත්වයකින් යුතුව 1995 වසර තුළදී පවත්වාගෙන යන ලදී. ඒ අනුව, අත්කම් භාණ්ඩ, ස්වර්ණාභරණ සහ සම්භාණ්ඩ වැනි එකතු කළ අගය ඉහළ මට්ටමක පවතින භාණ්ඩ ද ඇතුලත් සම්ප්‍රදායික නොවන නිෂ්පාදිත අංශයන් බොහොමයක් සඳහා වැඩමුළු පවත්වන ලදී. ඇඟළුම් නිෂ්පාදකයින් සහ එයට අදාල අතුරු සේවාවන් සපයන්නන් සඳහා "ඇඟළුම් 95" (Apparel 95) වෙළෙඳ ප්‍රදර්ශනය, 1995 ඔක්තෝබර් මස පවත්වන ලදී. ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව (ශ්‍රී.ල.අ.ණ.ර.ස.) මගින් අපනයන කරුවන්ට රක්ෂණ ආවරණ යෝජනා ක්‍රමය සහ බැංකු ඇපකර නිකුත් කිරීම මගින් පහසුකම් සළසාදෙන ලදී. 1995 වසර තුළ නිකුත් කරණ ලද මුළු රක්ෂණ ආවරණ

**විශේෂ සටහන 7**

# දකුණු ආසියානු වරණීය වෙළෙඳ වැඩපිළිවෙල

දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංවිධානයෙහි (South Asian Association for Regional Coporation - SAARC) සාමාජික රටවල් වූ බංගලාදේශය, භූතානය,ඉන්දියාව, මාලදිවයින, නේපාලය, පකිස්ථානය සහ ශ්‍රී ලංකාව යන රටවල් අතර ඇති වූ එකඟතාව මත, 1995 දෙසැම්බර් මස 7 දින සිට ක්‍රියාත්මක වන පරිදි දකුණු ආසියානු වරණීය තීරුබදු වැඩපිළිවෙල 'සැප්තා' (South Asian Preferential Trading Arrangement-SAPTA) ඇරඹුණි. තීරුබදු සහ තීරුබදු නොවන වෙළෙඳ බාධක ඉවත් කිරීම තුලින් කලාපය තුල ආර්ථික සහයෝගිතාව සහ වෙළෙඳාම වර්ධනය කිරීම මෙම වැඩපිළිවෙලෙහි අරමුණ විය. දකුණු ආසියානු වරණීය වෙළෙඳ වැඩපිළිවෙල (සැප්තා) ප්‍රතිපත්තිමය ලෙස පදනම් වී ඇත්තේ සාමාජික රටවල් අතර ආර්ථික සහ කාර්මික සංවර්ධන මට්ටම්, විදේශ වෙළෙඳ රටාවන් සහ තීරුබදු ප්‍රතිපත්ති පිළිබඳව පවත්නා වෙනස්කම් සැලකිල්ලට ගනිමින් සමස්ත වශයෙන් එකිනෙකාට පිරිනමනු ලබන වෙළෙඳ සහන සහ අන්‍යෝන්‍ය වාසි සියලු සාමාජික රටවල් අතර සමාන ලෙස බෙදී යන ආකාරයෙනි. සාමාජික රටවල් අතර ආර්ථික සංවර්ධනයේ විවිධ මට්ටම් අනුව පවත්නා දැඩි වෙනස්කම් සැලකිල්ලට ගනිමින් (සංඛ්‍යා සටහන් අංක 1), ඉතාම අඩු දියුණු සාමාජික රටවල් සඳහා විශේෂිත සහන පිරිනැමීමට මෙම වැඩපිළිවෙලේ සාමාජික රටවල් එකඟ වී ඇත. මෙම විශේෂිත සහන වන්නේ, තීරුබදු රහිතව පිවිසීමේ අවස්ථා ලබාදීම සහ වඩා පුළුල් තීරුබදු සහන ලබාදීම, වෙළෙඳම නිර්බාධකරණය කිරීමේ ක්‍රියාවලියේදී වඩාත් නම්‍යශීලි වීමට ඉඩ ලබාදීම සහ අමතර වෙළෙඳ ක්‍රියාමාර්ග සහ ආරක්ෂණයන් ලබාදීම ආදියයි.

බැලීමට එකඟ විය. දිගු කලක් ගතවන, එමෙන්ම දුෂ්කර වූ එක් එක් භාණ්ඩ වෙන් වෙනව සැලකිල්ලට ගනිමින් තීරුබදු සහන ලබාදීමට පියවර ගනු ලබනවාට අමතර වශයෙන්, වෙළෙඳාම නිර්බාධකරණය කිරීමේ ක්‍රියාවලිය වඩාත් වේගවත් කිරීම සඳහා නිෂ්පාදිත අංශ වශයෙන් මෙන්ම සියලු භාණ්ඩ වර්ගයන්ට එකවර බල පවත්වන පදනමකින් තීරුබදු සහන ලබාදීමට පියවර ගැනීම කෙරෙහි මෙම අන්තර් රාජ්‍ය හවුලේ දැඩි අවධානය යොමුවිය.

ආර්ථික කටයුතු සම්බන්ධයෙන් පෞද්ගලික අංශයේ සහභාගීත්වයේ නැඹිපෙනෙන වැදගත්කම සැලකිල්ලට ගනිමින් සාමාජික රටවල පෞද්ගලික අංශයන් අතර සමීප සහයෝගිතාවක් ඇරඹීමට හා පවත්වා ගැනීමට අපේක්ෂා කරන ලදී. මේ අනුව 'සාක්' සාමාජික රටවල ව්‍යාපාරික ප්‍රජාවේ ප්‍රධානීන්ගේ හමුවක් 1995 අගෝස්තු මස කොළඹදී පවත්වන ලදී. මෙහිදී ඉදිරි සාකච්ඡා සඳහා පදනමක් වශයෙන් ඒ ඒ අංශයන්ට අදාල කරුණු සාකච්ඡා කිරීම සඳහා වෙන්වූ කමිටු පිහිටුවීමට තීරණය කරන ලදී. පෞද්ගලික අංශය අතර ආර්ථික සහයෝගීතාව සඳහා තවදුරටත් හැදෑරීමටත් ඊට අදාල ක්‍රියාපිළිවෙත් හඳුනාගෙන ඒවා ක්‍රියාත්මක කිරීමටත් ඒ ඒ කමිටු පිළිබඳව වෙන් වෙනව සාමාජික රටවල් වෙතට වගකීම් පවරා දෙනු ලැබීය. මෙසේ පුළුල් ලෙස පැතිර ගිය අංශ ගණනාවක් ඇතුලත් වූ අතර ඒවා නම්, කෘෂිකර්මාන්තය (භූතානය), පසුතල පහසුකම් සහ බලශක්තිය (පාකිස්ථානය), කර්මාන්ත (බංගලාදේශය), ආයෝජන සහ වෙළෙඳම (නේපාලය), පර්යේෂණ සහ සංවර්ධනය (ඉන්දියාව), සේවාවන් (ශ්‍රී ලංකාව) සහ සංචාරක කර්මාන්තය (මාලදිවයින) යි.

1996 වසර් මාර්තු මස පැවැත්වීමට නියමිත වෙළෙඳම

සංඛ්‍යා සටහන 1

## සැප්තා සාමාජික රටවල් සඳහා සංසන්දනාත්මක ආර්ථික දර්ශක

| රට | මූර්ත දළ දේනි. වර්ධනය % 1980-1993 | ආයෝජන වර්ධනය % 1980-1993 | උද්ධමන අනුපාතිකය % 1980-1993 | ඒකපුද්ගල ජාතික ආදායමෙහි මිලදී ගැනීමේ හැකියාව එ.ජ.ඩො. 1993 | පුද්ගලයන් 1000ක් සඳහා ප්‍රධාන දුරකථන සැපයුම් මාර්ග 1992 | විදුලිබල නිපදවුම් කි.වො./ පුද්ගලයෙක් සඳහා 1992 | වැඩිහිටි සාක්ෂරතා අනුපාතිකය % 1992 | ප්‍රාථමික ශිෂ්‍ය ගුරු අනුපාතිකය 1992 | උපත් වර්ෂවල ජීවිත අපේක්ෂාව 1993 |
|---|---|---|---|---|---|---|---|---|---|
| බංගලාදේශය | 4.2 | 1.6 | 8.6 | 1,290 | 2 | 79 | 36.4 | 63 | 56 |
| භූතානය | - | - | - | - | - | - | 39.2 | - | - |
| ඉන්දියාව | 5.2 | 5.7 | 8.7 | 1,220 | 8 | 373 | 49.9 | 63 | 61 |
| මාලදිවයින | - | - | 10.0 | - | - | - | 92.6 | - | 63 |
| නේපාලය | 5.0 | - | 11.5 | 1,020 | 3 | 45 | 25.6 | 39 | 54 |
| පකිස්ථානය | 6.0 | 5.6 | 7.4 | 2,170 | 10 | 435 | 35.7 | 41 | 62 |
| ශ්‍රී ලංකාව | 4.0 | 2.4 | 11.1 | 2,990 | 8 | 200 | 89.3 | 29 | 72 |

මූලය : ලෝක සංවර්ධන වාර්තාව - 1995
මානුෂික සංවර්ධන වාර්තාව - 1995

ආරම්භයක් වශයෙන් තීරුබදු, අතිකුත් ගාස්තු සහ තීරුබදු නොවන වෙළෙඳ බාධක අඩුකිරීමට හෝ ඉවත් කිරීමට සහ සෘජු වෙළෙඳ ක්‍රියා පිළිවෙත් මඟින් අන්‍යෝන්‍ය වශයෙන් වෙළෙඳම වැඩිදියුණු කිරීමට සාමාජික රටවල් එකඟ විය. පළමු වෙළෙඳ සාකච්ඡා වටය අවසානයේදී, නිෂ්පාදිත භාණ්ඩ වර්ග 226 ක් සඳහා (සංඛ්‍යා සටහන 2) තීරුබදු සහන ලබාදීමට සාමාජික රටවල් එකඟ විය. 1995 අවසාන වන විට අත්පත් කරගත් ප්‍රගතිය, 'සාක්' (SAARC) සාමාජික රටවල් අතර මුළු වෙළෙඳාමෙන් සියයට 1 ක් පමණ වූ නිෂ්පාදිත භාණ්ඩ ආවරණය වන පරිදි තීරුබදු සහන ලබාදීමට පමණක් සීමා වූ නමුත්, වඩා පුළුල් ලෙස වෙළෙඳ භාණ්ඩ ආවරණය වන පරිදි සාමාජික රටවල් අතර වෙළෙඳම නිර්බාධකරණය කිරීමේ සීඝ්‍ර ප්‍රගතියක් අත්පත් කර ගැනීම සඳහා තවදුරටත් අවශ්‍ය පියවර ගත යුතුය. 1995 දෙසැම්බර් මාසයේ රැස් වූ මෙම වරණීය වෙළෙඳ ගිවිසුමේ වෙළෙඳම නිර්බාධකරණය සඳහා වූ අන්තර් රාජ්‍ය හවුල මඟින් තීරුබදු නොවන සහ අනෙකුත් වෙළෙඳ බාධක ඉවත් කිරීමත්, තීරුබදු සහන වඩාත් පුළුල් ලෙස ලබාදීමත් පිළිබඳව මෙහි දෙවන සාකච්ඡා වටයේදී සළකා

නිර්බාධකරණය සඳහා වූ අන්තර් රාජ්‍ය කණ්ඩායමේ දෙවන සාකච්ඡා වටයේදී, තීරුබදු නොවන ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය ක්‍රම වේදයන් හඳුනා ගැනීම, රේගු ක්‍රියාපිළිවෙත් වඩාත් සරල, අනුගත සහ ක්‍රමවත් කිරීම, නිශ්චිත කාලසටහනක් මත පිහිටා තීරුබදු හා වෙනත් ගාස්තු මෙන්ම තීරුබදු නොවන සීමාකරණ ඉවත් කිරීම, සහන සපයන භාණ්ඩ වර්ග සංඛ්‍යාව පුළුල් කිරීම සහ වඩා පුළුල් ලෙස තීරු බදු අඩුකිරීම ආදි කරුණු සම්බන්ධයෙන් දැඩි ලෙස අධ්‍යයනය කිරීමට අපේක්ෂිතය. දකුණු ආසියා වරණීය වෙළඳ වැඩපිළිවෙලේ රටවල් අතර සීඝ්‍ර ලෙස වෙළෙඳම නිර්බාධකරණය ක්‍රියාත්මක කිරීම මඟින් බොහෝදුරට ක්‍රි.ව. 2000 වන විට හෝ නියත වශයෙන්ම ක්‍රි.ව. 2005 ට පෙර දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංවිධානයේ රටවල් අතර නිදහස් වෙළෙඳ කලාපයක් (Free Trade Area) පිහිටුවීමට අපේක්ෂා කරනු ලැබේ.

මෙම වරණීය වෙළඳ හවුලේ රටවල් අතර වෙළෙඳාම එම රටවල මුළු වෙළෙඳ වටිනාකමෙන් සියයට 3 ක් පමණක් (සංඛ්‍යා සටහන 3) වන

සංඛ්‍යා සටහන 2

## තීරුබදු සහනයන් පිළිබඳ සැප්තා උපලේඛන

විශේෂ සටහන 7 (සම්බන්ධයි)

| රට | තීරුබදු භාණ්ඩ සංඛ්‍යාව | ප්‍රධාන නිෂ්පාදිත වර්ග | සැප්තා යටතේ හිමි බදු සහන (තීරුබද්දේ ප්‍රතිශතයක් ලෙස) | පවතින තීරු බදු අනුපාත (අ) |
|---|---|---|---|---|
| බංගලාදේශය | 12 | කිරි, කරදමුංගු, පිටි කල පොල් කිරි, ශල්‍ය සහ දන්ත නිෂ්පාදිත, ප්‍රථමාධාර පෙට්ටි සහ උපකරණ කට්ටල, අත්‍යාවශ්‍ය තෙල් වර්ග, කෘමිනාශක, අගනා ගල් වර්ග | 10% | 7.5% - 60% |
| භූතානය | 11 | අර්ධ වශයෙන් සහ පූර්ණ වශයෙන් සකස් කළ මත්ස්‍ය නිෂ්පාදිත, චොකලට් සහ කොකෝවා අඩංගු අනෙකුත් ආහාර, ධාන්‍ය නිෂ්පාදන වර්ග, පිටි සහ කැඳ, රූපලාවන්‍ය හෝ විලාසිතා සැකසුම්, සෝදන සහ ඇඟ ගල්වන සබන් වර්ග රබර් ටයර් සහ ටියුබ්ස්, රබර් ඇතිරිලි, අගනා සහ අර්ධ අගනා ගල් වර්ග, ශල්‍ය භාණ්ඩ සහ ක්‍රීඩා භාණ්ඩ | 10% - 15% | 10% - 50% |
| ඉන්දියාව | 106 | කරවල, කුලුබඩු වර්ග, කජු කඩල, පිටි කල සහ යොදය ලෙස සකස් කල පොල්කිරි, කොකෝවා සහ කොකෝවා සැකසුම්, පොහොර, රබර් ටයර් සහ ටියුබ්ස් සහ අනෙකුත් රබර් උපකරණ, සම්භාණ්ඩ, කඩදාසි සහ ඝන කඩදාසි, කපු නූල්, පිගන් භාණ්ඩ සහ තඹ අපහරණයන් සහ පුන්බුන්, පිටි වශයෙන් හෝ පතුරු වශයෙන් වූ ස්වාභාවික මිනිරන් | 10% -100% | 0% - 50% |
| මාලදිවයින | 17 | පරිප්පු, ඇස්පරාගස්, තක්කාලි කෙචප්, ස්ට්‍රෝබෙරි, ස්වාභාවික මිනිරන්, සුවඳ විලවුන් සහ ශරීරාපිත දියර, රබර් ටියුබ්ස්, ගෙබිම් ආවරණයන් සහ පැදුරු, සම් සහ සම් භාණ්ඩ, අමු හණ, ලෝම වලින් සැකසූ ඇතිරිලි හෝ පලස් සහ ක්‍රීඩා භාණ්ඩ. | 7.5% | 15% - 25% |
| නේපාලය | 14 | අමු හෝ වියලූ පළතුරු, කුළු බඩු, කොහු බත්, ටින් මාලු, සීනි ආවරනිත හෝ නොවන චූයින්ගම්, පිප්සම්, ගල් අඟුරු, මාෂධ වර්ග, ස්වාභාවික රබර්, සම් නිමැවුම් සහ ලී බඩු. | 7.5% - 10% | 0% - 30% |
| පකිස්තානය | 35 | පරිප්පු, කුළු බඩු, ඖෂධීය පැළ වර්ග, විසිතුරු මසුන්, රතු කොරල් පර, කපාපු පොල්, ස්වාභාවික රබර්, ස්වාභාවික මිනිරන්, උණ බට, බුලත්, සම්, කඩදාසි සහ ඝන කඩදාසි, මුද්‍රිත පොත්, අමු හෝ සැකසූ හණ | 10% - 15% | 10% - 70% |
| ශ්‍රී ලංකාව | 31 | එළවලු ඇට, යකඩ කදන් සහ කූරු, මිශ්‍ර නොකළ ඇළුමිණියම්, පදන්කල දැව කුට්ටි උම්බලකඩ සහ කරවල, පළතුරු සහ සැකසූ පළතුරු, කොත්තමල්ලි, වියළි ඉඟුරු, පදම් කිරීමේ සහ ඩයි කිරීමේ දියර, දැව, කුනී ලෑලි සහ පදම් කල දැව, හණ කෙඳි බිම් ඇතිරිලි, වානේ කම්බි පොලු සහ කූරු, තැටි, තහඩු සහ ඇළුමිනියම් පටි, යන්ත්‍රෝපකරණ සහ ඒවායේ අමතර කොටස්, රථවාහන අමතර කොටස් සහ උපාංග, මෝටර් සයිකල්, පාපැදි සහ ඒවායේ කොටස් | 10% - 20% | 10% - 35% |
| එකතුව | 226 | සියළුම ශීර්ෂයන් | 32 (ආ) | |

(අ) සාමාජික රටවල ජාතික තීරුබදු උපලේඛන වල ඇතුළත් තීරුබදු
(ආ)පරාසය සඳහන් කල අවස්ථාවන්හිදී මාධ්‍ය අගය මත පදනම් වූ බරතැබූ සරල සාමාන්‍යය

සංඛ්‍යා සටහන 3

## සැප්තා සාමාජික රටවල මූලික ආර්ථික දත්ත

| රට | ජනගහනය එකතුව දශලක්ෂ | ද.දේ.නි. එ.ජ.ඩො දශලක්ෂ | කලාපයේ ද.දේ.නි සඳහා රටෙහි දායකත්වය | ඒක පුද්ගල ද.ජා.නි එ.ජ.ඩො | අපනයන එ.ජ.ඩො දශලක්ෂ | ආනයන එ.ජ.ඩො දශලක්ෂ | මුළු වෙළෙඳාමෙහි ප්‍රතිශතයක් ලෙස සැප්තාහි අන්තර් වෙළෙඳාම |
|---|---|---|---|---|---|---|---|
| බංගලාදේශය | 115.2 | 23,787 | 7.1 | 215 | 2,263 | 3,968 | 8.6 |
| භූතානය | 1.6 | 227 | 0.1 | 129 | - | - | - |
| ඉන්දියාව | 901.5 | 250,593 | 75.3 | 274 | 20,934 | 22,131 | 2.0 |
| මාලදිවයින | 0.2 | 152 | 0.0 | 633 | 35 | 185 | 16.4 |
| නේපාලය | 20.8 | 3,481 | 1.0 | 167 | 385 | 868 | 8.3 |
| පකිස්ථානය | 122.8 | 44,553 | 13.4 | 367 | 6,235 | 8,803 | 1.6 |
| ශ්‍රී ලංකාව | 17.6 | 10,084 | 3.0 | 565 | 2,788 | 3,905 | 6.4 |
| එකතුව | 1,179.7 | 332,876 | 100.0 | 280 | 32,638 | 39,860 | 3.2 |

මූලය : අන්තර් ජාතික මූල්‍යමය සංඛ්‍යා වාර්ෂික පොත - 1995
වෙළඳ දිශාව සංඛ්‍යා වාර්ෂික පොත - 1995

නමුත් මෙහි වැදගත්කම රඳා පවතින්නේ කලාපයේ සාමාජික රටවල් සමඟ පමණක් නොව සාමාජිකයන් නොවන රටවල් සමඟද වෙළෙඳ අවස්ථා වැඩිදියුණු කිරීමේ සහ වඩාත් පුළුල් කිරීමේ අරමුණින් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිත වෙළෙඳාම ලිහිල් කිරීමේ ක්‍රියා මාර්ග මතය. වරණීය වෙළෙඳ හවුලේ රටවල් අතුරින් වඩාත් නිර්බාධ වෙළෙඳ ක්‍රමයක් ඇති රටක් වූ ශ්‍රී ලංකාව, දකුණු ආසියාතු වරණීය වෙළඳ වැඩපිළිවෙලේ කලාපීය සහයෝගීතාව යටතේ සම්පූර්ණයෙන්ම නිදහස් වූ වෙළෙඳ ක්‍රමයක් වෙතට පරිවර්තනය වනු ඇති අතර, එය නිදහස් ලෝක වෙළෙඳ ක්‍රමයක් ඇත්පත් කර ගැනීම සඳහා ලෝක වෙළෙඳ සංවිධානය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත අවසාන උරුගුවේ සාකච්ඡා වටය හා සම්බන්ධ වෙළෙඳ ප්‍රතිසංස්කරණයන්හි අරමුණුවලටද අනුකූලවනු ඇත.

**සංඛ්‍යා සටහන 4 - 1995 වසර තුළ සැප්තා රටවල් සමඟ ශ්‍රී ලංකාවේ වෙළෙඳාම (ඇ.එ.ජ. ඩොලර් දශලක්ෂ)**

| රට | අපනයන | ආනයන |
|---|---|---|
| බංගලාදේශය | 12.0 | 5.6 |
| භූතානය | - | - |
| ඉන්දියාව | 31.9 | 469.2 |
| මාලදිවයින | 14.3 | 16.8 |
| නේපාලය | 0.4 | 0.7 |
| පකිස්ථානය | 43.4 | 52.4 |
| සැප්තාහි ප්‍රතිශතයක් ලෙස | 2.7 | 10.5 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

සහ ඉදිරි පුරුකුම් (enhancements) සංඛ්‍යාව සියයට 43 කින් ඉහළ ගිය අතර, ඒවායේ වටිනාකම සියයට 71 කින් වැඩිවිය. එසේ වුවද, නිකුත් කරණ ලද ඇපකර සංඛ්‍යාව සියයට 10 කින් පහත වැටුණු අතර, ඒවායේ වටිනාකම සියයට 19 කින් අඩුවිය. මැණික් සහ ස්වර්ණාභරණ අපනයනකරුවන් විදේශීය ප්‍රදර්ශන වලට සහභාගි වීමේදී තීරු බදු රහිතව පිවිසීමේ පහසුකම් ලබාදීම සඳහා 1994 දී හඳුන්වාදෙන ලද ණය සහතික යෝජනා ක්‍රමය තවදුරටත් පවත්වාගෙන යනු ලැබූ අතර, ඇපකර නිදහස්කර ගැනීම කඩිනම් කිරීම දිරිගැන්වීම් සඳහා බදු ප්‍රතිදාන ක්‍රමයක්ද හඳුන්වා දෙන ලදී. මීට අමතරව අන්තරාල වෙළෙඳුන්ට පහසුකම් සැළසීම සඳහා රක්ෂණ ඔප්පු ලබාදීමේ යෝජනා ක්‍රමයක්ද 1995 දී ආරම්භ කරන ලදී.

සුළු පරිමාණ තේ අපනයනකරුවන්ගේ තොග පවත්වා ගැනීමේ වියදම අවම කිරීමට උපකාරිවන අරමුණින්, ගුදම් පවත්වා ගැනීමේ සංකල්පය මත පදනම්ව රුසියාවත් සමඟ ශ්‍රී ලංකාව, හවුල් ව්‍යාපාරයකට අවතීර්ණ විය. පසුගිය වර්ෂ කිහිපය තුල අහිමි වූ පකිස්ථාන තේ වෙළෙඳපල යලි අත්පත් කරගැනීම සඳහා පකිස්ථානය සමඟද හවුල් ව්‍යාපෘතියක් අරඹන ලදී. මේ අනුව තොග ස්වරූපයෙන් පකිස්ථානයට අපනයනය කරන තේ, පැකට් කොට පකිස්ථානයේ 840 ක් වූ වෙළෙඳසල් තුළින් අලෙවි කරනු ඇත.

## වෙළෙඳ සබඳතා, වෙළෙඳ වැඩපිළිවෙලවල් සහ නිශ්කාෂණ වැඩපිළිවෙලවල්

ශ්‍රී ලංකාව, 1995 ජනවාරි මස ආරම්භ කරන ලද ලෝක වෙළෙඳ සංවිධානයේ (World Trade Organisation) ආරම්භක සාමාජිකයෙක් විය. ලෝක වෙළෙඳ සංවිධානයට වූ බැඳීම් අනුව, කෘෂිකාර්මික භාණ්ඩ 2,228 ක් සඳහා වූ තීරුබදු අනුපාතිකයන් සියයට 50 ක මට්ටමේ පවත්වාගත යුතුවිය. කෘෂිකාර්මික අංශයට සමාන උපරිම අනුපාතයන් පැවති කාර්මික නිෂ්පාදිතයන් සඳහා වූ ආනයන බදු වගකීම් වලට බැඳීමේ අවස්ථාවන් සීමා සහිත විය. සේවා සහ වෙළෙඳාම සම්බන්ධ පොදු ගිවිසුම (General Agreement on Trade and Services) යටතේ වූ ශ්‍රී ලංකාවේ වගකීම්, සංචාරක කර්මාන්තයට හා ඊට අදාල සේවාවන්ට සීමා විය. එසේ වුවද ශ්‍රී ලංකාවේ දැනට පවතින වෙළෙඳ ප්‍රතිපත්ති රාමුව ලෝක වෙළෙඳ සංවිධානයේ බැඳීම් වලට වඩා බෙහෙවින් නිර්බාධ එකක් විය. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ පවතින උපරිම තීරුබදු අනුපාතය, ලෝක වෙළෙඳ සංවිධානයේ උපරිම බැඳීම් අනුපාතය වන සියයට 50 හා සැසැඳීමේදී සියයට 35 ක් ලෙස අඩු මට්ටමක පැවතුණි. එමෙන්ම සේවා අංශය දැනටමත් විදේශීය තරඟකාරිත්වයට විවෘත කොට තිබේ. (මූල්‍ය සේවාවන්හිද මුළු ආයෝජන වලින්, සියයට 49 ක් දක්වා විදේශීය සහභාගිත්වයට විවෘතය.)

ලෝක වෙළෙඳ සංවිධානය, ශ්‍රී ලංකා රජය සමඟ සාකච්ඡා කොට, ශ්‍රී ලංකාවේ වෙළෙඳ ප්‍රතිපත්ති සහ වෙළෙඳ ක්‍රියාකාරිත්වය පිළිබඳව ප්‍රධාන විමසුමක් කරනු ලැබිය. මෙම කාර්යයේ අරමුණ වූයේ ගැට් ගිවිසුම සහ ලෝක වෙළෙඳ සංවිධානයේ නීති, ආචාරධර්ම සහ වගකීම්වලට අනුගතවීම වර්ධනය කිරීමට උපකාර වෙමින් එහි දායකත්වය මගින් බහු පාර්ශවීය වෙළෙඳ රටාවේ මනා ක්‍රියාකාරිත්වයක් පවත්වාගෙන යාමය. පෙර පැවති ආනයන ආදේශන ප්‍රතිපත්ති හේතුකොට ඇතිවූ විෂමතා ඉවත් කිරීමේලා ශ්‍රී ලංකාව කැපී පෙනෙන දියුණුවක් ඇති කරගෙන ඇති අතර, වෙළෙඳ ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරිත්වය යහමඟට පිවිස ඇති බවත් 'වෙළෙඳ ප්‍රතිපත්ති විමසුම්' කමිටුවේ නිගමනය විය. වෙළෙඳාම විවෘත කිරීම, නීති ලිහිල් කිරීම සහ පෞද්ගලීකරණය හේතුකොටගෙන සේවා නියුක්තිය සහ ආර්ථික වර්ධනයට අදාල තත්ත්වයන් වැඩි දියුණු කර ඇති බව කමිටුව විසින් පිළිගනු ලැබූ අතර, බදු සහ ආනයන තීරු බදු ව්‍යුහය තවදුරටත් විධිමත් කිරීම සඳහා ශ්‍රී ලංකාව ගන්නා උත්සාහයන් පිළිබඳව කමිටුවේ පැසසුම හිමි විය. ශ්‍රී ලංකාව සිය ආර්ථිකය විවෘතකරණය කිරීමේ ඉදිරි වැඩපිළිවෙල ඔස්සේ තවදුරටත් ගමන් කිරීමේත් ඉහළ මට්ටමක බහුපාර්ශවීය බැඳීම් පිළිගැනීමේත් සහ ලෝක වෙළෙඳ සංවිධානයේ ක්‍රියාමාර්ග ඉක්මණින් ක්‍රියාත්මක කිරීමේත් වැදගත්කම කමිටුව අවසන් වශයෙන් අවධාරණය කරන ලදී.

77 කණ්ඩායමේ සාමාජිකයන් වන සංවර්ධනය වෙමින් පවතින රටවල් අතර අන්තර් කලාපීය සහයෝගිතාව සඳහා වූ ප්‍රථම යෝජනාව වූ වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමයෙහි (Global System of Trade Preferences) දෙවන වටයට ශ්‍රී ලංකාව සහභාගි විය. ශ්‍රී ලංකාව නියෝජිත රටවල් 16 ක් සමඟ ඉල්ලීම් සහ ලබාදීම් පිළිබඳ ලැයිස්තු හුවමාරු කරගනු ලැබිය. 1995 වසර තුල මෙහි සැසිවාර දෙකක් පවත්වන ලද අතර, 1996 අප්‍රේල් මස පැවැත්වීමට නියමිත අන්ක්ටාඩ් (UNCTAD) නව වන සමුළුවට බොහෝ දිනකට පෙර එනම් 1996 මාර්තු මස වන විට මෙහි සාකච්ඡා වටයන් නිමකිරීමට අපේක්ෂිතය.

1995 වසර තුල ක්‍රියාත්මකව පැවති පොදු වරණීය ක්‍රමයෙහි (General System of Preference) පහසුකම් ලබන රටක් වශයෙන් ශ්‍රී ලංකාව තවදුරටත් පැවතුණි. ඇමරිකා එක්සත් ජනපදය, ජපානය සහ යුරෝපා හවුලේ සාමාජික රටවල්ද ඇතුලත්ව, වරණයන් ප්‍රදානය කරනු ලබන රටවල් 27 ක් මගින් පොදු වරණීය ක්‍රමය යටතේ විවිධ යෝජනා ක්‍රම 16 ක් ක්‍රියාත්මක කරන ලදී. 1995 ජනවාරි මස සිට යුරෝපා හවුලේ රටවල් මගින් ලබාදෙන පොදු වරණීය ක්‍රමයෙහි සංශෝධන සිදුකරන ලදී. මේ අනුව, දියුණු වෙමින් පවතින රටවල් ක්‍රමයෙන් ඉහළ තලයකට නංවාලන මූලධර්ම අදාල කර ගැනීම, ඉතාමත්ම අඩු දියුණු රටවල් සහ මත්ද්‍රව්‍ය හුවමාරුව වැලැක්වීමේ වැඩ පිළිවෙලවල් ක්‍රියාත්මක කරන රටවලට වෙනම විශේෂ පහසුකම් ලබාදීම ආදී නවාංග මීට ඇතුලත් විය. එමෙන්ම පොදු වරණීය ක්‍රමය යටතේ පෙර පැවති පංගු සහ උපරිම සීමාවන් ආදිය ඉවත් කළ අතර, ඒවා බදු ක්‍රමය තුලට අනුගත කරන ලදී. යුරෝපා හවුලේ මෙම ක්‍රමය යටතේ ආවරණය වන සියළුම නිෂ්පාදිත භාණ්ඩ, අධිසංවේදී, සංවේදී, අර්ධ සංවේදී සහ සංවේදී නොවන ලෙස අංශ හතරකට වර්ගීකරණය කරන ලදී. ප්‍රධාන වශයෙන්ම රෙදි පිළි නිෂ්පාදිත ඇතුලත් වූයේ අධි සංවේදී කාණ්ඩයට වන අතර, පොදු වරණීය ක්‍රමය යටතේ මේවාට ලබා දෙන ලද තීරු බදු සහන තවදුරටත් අඩුකරන ලදී. යුරෝපා හවුලේ නව පොදු වරණීය ක්‍රමයේ සමහර අංග හේතුකොටගෙන ශ්‍රී ලංකාවට ඇතිවිය හැකි අයහපත් ප්‍රතිවිපාක පිළිබඳව වාණිජ දෙපාර්තමේන්තුව විසින් යුරෝපා හවුල වෙත 1995 වසරේ දී කරුණු ඉදිරිපත් කරන ලදී.

1997 වසරේ ජනවාරි පළමුවන දින පටන් ක්‍රියාත්මක වීමට නියමිත ජාත්‍යන්තර ස්වභාවික රබර් ගිවිසුම (III වන ගිවිසුම) ට 1995 වසරේදී ශ්‍රී ලංකාව අත්සන් තබන ලදී. පෙර පැවති ගිවිසුම යටතේ සිදුකළ පරිදිම, වෙළෙඳ පලට බලපෑම් ඇතිකිරීමේ එකම මාර්ගය වශයෙන් මෙට්‍රික් ටොන් 550,000ක් වූ ජාත්‍යන්තර රබර් තොග සංචිත පවත්වාගැනීම මගින් ස්වභාවික රබර් මිල ස්ථායිකරණය කිරීමට මෙම ගිවිසුම මගින් පියවර ගනු ලැබේ. ශ්‍රී ලංකාවේ සමස්ථ රබර් නිෂ්පාදනය මෙන්ම රබර්

අපනයන ප්‍රමාණය ද ජාත්‍යන්තර රබර් වෙළෙඳපල සමඟ සාපේක්ෂව සළකන කල, වෙළෙඳපල තත්වයන් කෙරෙහි බලපෑමක් ඇතිකළ නොහැකි තරම් ඉතා සුළු ප්‍රමාණයක් වුවද, රබර් ගිවිසුමේ සාමාජිකයෙකු ලෙස සිටීම ශ්‍රී ලංකාවට වාසිදායක යයි සළකන ලදි.

ඉතා තීරණාත්මක ද්විපාර්ශවික සහ බහු පාර්ශවික සාකච්ඡා රැසකින් පසුව, 1995 දෙසැම්බර් මස 7 දින සිට ක්‍රියාත්මක වූ දකුණු ආසියා වරණීය වෙළෙඳ වැඩ පිළිවෙළෙහි (South Asian Preferential Trading Arrangement) ශ්‍රී ලංකාව ආරම්භක සාමාජිකයෙකු විය. දකුණු ආසියාතු වරණීය වෙළෙඳ වැඩපිළිවෙලේ අරමුණු වූයේ දකුණු ආසියාතු කලාපීය සහයෝගිතා සංවිධානයේ (South Asian Association for Regional co-operation) සාමාජික රටවල් අතර අන්‍යෝන්‍ය වෙළෙඳාම සහ ආර්ථික සහයෝගිතාව පවත්වා ගැනීම සහ එය තවදුරටත් වර්ධනය කිරීමයි. බදු අනුපාත මත පදනම් වූ භාණ්ඩ වර්ග 226 ක් ආවරණය වන පරිදි එකඟ වූ බදු සහන පිළිබඳ සංක්ෂිප්ත ජාතික ලැයිස්තුව සඳහා ශ්‍රී ලංකාව ද භාණ්ඩ වර්ග 31 ක් සඳහා බදු සහන ලබාදීමට එකඟවිය. සියළුම සාමාජික රටවල් එකඟ වූ සහන බදු අනුපාත සහිත භාණ්ඩ ප්‍රමාණය වන්නේ, ඉන්දියාව 106, පකිස්ථානය 35, ශ්‍රී ලංකාව 31, මාලදිවයින 17, නේපාලය 14, බංගලාදේශය 12 සහ භූතානය 11.

බැංකොක් ගිවිසුම යටතේ එහි සාමාජික රටවල් වන බංගලාදේශය, ඉන්දියාව, ලාඕසය සහ කොරියාතු සමූහාණ්ඩුව වැනි රටවලින් වරණීය පිවිසුම් පහසුකම් (අඩු තීරුගාස්තු යටතේ භාණ්ඩ එම වෙළෙඳපලවල්වලට ඉදිරිපත් කිරීම) තවදුරටත් ශ්‍රී ලංකාවට හිමිවිය.

ද්විපාර්ශවික මට්ටමින් පවතින සහයෝගිතාවන්ට අනුව, ශ්‍රී ලංකාව හා මාලදිවයින අතර ආර්ථික සහ තාක්ෂණික සහයෝගිතාව සඳහා වූ ඒකාබද්ධ කොමිසමේ සිව්වන සැසිවාරය 1995 ජනවාරි මස කොළඹ දී අමාත්‍ය මට්ටමින් පවත්වන ලදී. අනිකුත් අංශවලට අමතරව මෙම සැසිවාරයේ මූලික අවධානය යොමු වූයේ වෙළෙඳාම සහ සංචාරක ව්‍යාපාරය යන අංශයන්හි දෙරට අතර සහයෝගිතාව වර්ධනය කිරීම කෙරෙහිය. 1995 පෙබරවාරි මස දී ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර වෙළෙඳාම, මූල්‍ය හා ආයෝජන කටයුතු පිළිබඳව වූ අනු කමිටු රැස්වීම පැවැත්විණි. මෙහිදී, දෙරට අතර අදාල අංශයන්හි ද්විපාර්ශවික සහයෝගිතාව ඇතිකර ගැනීම පිළිබඳව විමර්ශනය කළ අතර, වෙළෙඳාම සහ ආයෝජන කටයුතුවලට පහසුකම් සැලසීමට අදාල තීරණ ගන්නා ලදී. 1995 මාර්තු මස ගරු ජනාධිපතිනිය සහ දේශීය හා විදේශීය වෙළෙඳාම, වාණිජ සහ ආහාර ඇමතිවරයා ඉන්දියාවේ සහ බංග්ලාදේශයේ සංචාරය කල අවස්ථාවලදී මෙම විෂයයට අදාලව තවදුරටත් පියවර ගන්නා ලදී. මෙම සාකච්ඡාවලදී, ශ්‍රී ලංකාවේ අපනයන නිෂ්පාදිත ගණනාවක් සඳහා ලබාදී ඇති බදු සහන තවදුරටත් පවත්වා ගැනීමට ශ්‍රී ලංකාවට හැකිවිය. 1995 වසර තුළ ශ්‍රී ලංකාව ක්වේටය සහ සයිප්‍රසය සමඟ ද්විපාර්ශවික වෙළෙඳ ගිවිසුම්වලට එළඹිණ.

1995 වර්ෂයේ අග කොළඹදී පැවති සංගමයේ රැස්වීමේදී ඇමරිකා එක්සත් ජනපද ඩොලරය මත පදනම්ව ගනුදෙනු පියවිය හැකි නිශ්කාශන ක්‍රමයක් යොදා ගැනීමට ආසියාතු නිශ්කාශන සංගමයේ සාමාජික රටවල් එකඟ විය. මීට හේතු වූයේ පෙර පැවති නිශ්කාශන ක්‍රමය විගැහි පරිවර්තන අනුපාතය උපයෝගිකර ගනිමින් ඒ ඒ සාමාජික රටවල ජාතික ව්‍යවහාර මුදල් වලින් ගනුදෙනු පිය වූ නිසා එය ආසියාතු නිශ්කාශන සංගමයේ සාමාජිකයන් අතර වෙළෙඳාමේ වර්ධනයට බාධාවක් ලෙස ක්‍රියාත්මක වූ බව පෙනියාමය.

## ප්‍රාග්ධන පාලනයන්

1995 වසර තුළදී ද ප්‍රාග්ධන පාලන ක්‍රම නොවෙනස්ව පැවතිණ. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය තවදුරටත් ශ්‍රී ලංකාවේ විදේශ ආයෝජනයන් පිළිබඳ සම්පූර්ණ වගකීම දරන අධිකාරිය වූ අතර ශ්‍රී ලංකාවෙන් පිටතට ප්‍රාග්ධන ගලායෑම් විනිමය පාලන දෙපාර්තමේන්තුවේ පරීක්ෂාව යටතේ සිදුවිය. ආයෝජන කාණ්ඩ රාශියකම ප්‍රාග්ධන කොටස් නිකුතුවෙන් සියයට සියයක්ම ලබාගැනීමට විදේශ ආයෝජකයන්ට අවසර තිබුණි. අනිකුත් සමහර කාණ්ඩවල සියයට 40ක ප්‍රාග්ධන කොටස් නිකුතුවක් සඳහා ස්වයංක්‍රීය අනුමැතිය ලබාදුන් අතර ඊට වඩා වැඩි කොටස් සඳහා අනුමැතිය ඒ ඒ අවස්ථාව සලකා බලා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් හෝ අදාළ අධිකාරියෙන් ලබා දුනි. කාණ්ඩ කිහිපයක ආයෝජනයන් ශ්‍රී ලාංකිකයින් සඳහාම වෙන්වී පැවතිණ. ණය ආපසු ගෙවීම් යටතේ වූ ප්‍රාග්ධන ගලායෑම් සඳහා ඉඩ පහසුකම් බලය ලත් වෙළෙන්දන් මාර්ගයෙන් නිදහසේ ලබා දී තිබුණු අතර ඒ ඒ අවස්ථාව සලකා බලා විදේශයන්හි ආයෝජනය සඳහා පහසුකම් 1995 වසරේ ලබාදෙන ලදී. ඒ අනුව ලංකා බැංකුවට මදුරාසියේ සහ කරච්චියේ නව ශාඛා දෙකක් විවෘත කිරීමට අවසරය ලැබිණි. ලංකා බැංකුව විසින් නිකුත් කරන ලද ඇමෙරිකානු ඩොලර් පාවෙන අනුපාතික නෝට්ටු මගින් එහි විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයේ කටයුතු සඳහා අවශ්‍ය එ.ජ. ඩොලර් මිලියන 12 ක් එකතු කර ගැනීමට හැකි විය.

## 9.12 අභ්‍යන්තර වෙළෙඳාම

1995 වසරේදී අභ්‍යන්තර වෙළෙඳ ප්‍රතිපත්තිය මූලික වශයෙන්ම යොමු වූයේ පාරිභෝගික ආරක්ෂණය වෙතය. අභ්‍යන්තර වෙළෙඳ දෙපාර්තමේන්තුව (අ.වෙ.දෙ.) මගින් වෙළෙඳ අක්‍රමිකතා ඉවත් කිරීම සහ භාණ්ඩවල ගුණාත්මක තත්ත්වය පිළිබඳව විශේෂිත උපදෙස් මාලාවන් පරිපාලනය කිරීම ආදී කටයුතු ඉටු කරන ලදී. අ.වෙ.දෙ. මගින් වෙළෙඳ අක්‍රමිකතාවන්ට ලක් වූ පාරිභෝගිකයන්ගේ ගැටළු නිරාකරණයට අදාල ක්‍රියා පිළිවෙත් හා සම්බන්ධ සේවාවන් තවදුරටත් ව්‍යාප්ත කරන ලදී. මේ යටතේ 1995 වසර තුල දෙපාර්තමේන්තුවට ලැබුණු පැමිණිලි 867 ක් අතුරින් 429 ක් විසඳනු ලැබීය. මීට අමතර වශයෙන්, පොහොර අලෙවියේදී ඇතිවන අක්‍රමිකතා අඩුකිරීම අරමුණු කොටගෙන පැන වූ පොහොර පනත ක්‍රියාත්මක කිරීම සඳහා අ.වෙ.දෙ. මගින් කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යංශයට තවදුරටත් සහාය විය.

පාරිභෝගික ආරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීමේදී පැන නගින දුෂ්කරතා ඉවත් කරනු වස් 1995 වසර තුළ එම පනතට යම් යම් සංශෝධන හඳුන්වා දෙන ලදී. එසේ වුවද, 1995 වසර තුළ මෙම පනත යටතේ නව විධිවිධාන නිකුත් නොකෙරුණි.

මිනුම් පාවිච්චිය සහ පාලනය සම්බන්ධ දැනට පවතින නීතිය වඩා ක්‍රමවත් කිරීම සඳහා "මිනුම් ඳඩු සහ සේවාවන්" පිළිබඳ කෙටුම්පත 1995 වසරේදී පාර්ලිමේන්තුවෙන් සම්මත කරන ලදී. මේ අනුව පොදු සෞඛ්‍යය, පරිසරය සහ ආරක්ෂක තත්ත්වයන් සුරැකීම සඳහා නීතිමය වශයෙන් පිළිගන්නා සහතික නිකුත් කිරීම සඳහා නීතිමය රාමුවක් නිර්මාණය කර ගැනීමට

මෙම කෙටුම්පත ඉවහල් විය.

අලෙවි කටයුතු අධීක්ෂණය හා පරීක්ෂා කිරීමට අමතරව, ළ.වෙ.දෙ. මගින් පොදු ජනතාව මෙන්ම පාසල් ළමුන් සඳහා පාරිභෝගිකයන් දැනුවත් කිරීමේ වැඩපිළිවෙලවල් බොහොමයක් 1995 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලදී.

සාධාරණ වෙළෙඳ කොමිසම (සා.වෙ.කො.) මගින්, ඒකාධිකාරී තත්ත්වයන්, ඒකාබද්ධ වීම් සහ තරගකාරීත්වයට පටහැනි ක්‍රියාවන් හා සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමත්, දැනට මිල පාලනය යටතේ පවත්වාගනු ලබන එකම භාණ්ඩ වර්ගය වූ ඖෂධ වර්ගවල උපරිම අලෙවි මිල තීරණය කිරීමක් යන කටයුතු නොකඩවා කරන ලදී. කැබිනට් තීරණයක් අනුව, 1995 දෙසැම්බර් මස සිට ක්‍රියාත්මක වන පරිදි දේශීය වශයෙන් නිෂ්පාදනය කරනු ලබන අත්‍යවශ්‍ය ඖෂධ වර්ග 12 ක මිල පාලනයෙන් ඉවත් කරන ලදී. සා.වෙ.කො. මගින් සිමෙන්ති සහ ලූණු අලෙවිය සම්බන්ධයෙන් වූ අක්‍රමිකතා අවම කිරීමේ අරමුණින් පාරිභෝගික ආරක්ෂණ පනත යටතේ නියෝග නිකුත් කරන ලදී. මීට අමතරව, වෙළෙඳපලේ යහපත් මිල මට්ටම් පවත්වා ගැනීම අරමුණු කොටගෙන සබන්, දන්තාලේප, සහරා, පිටිකිරි සහ බිස්කට් යන ද්‍රව්‍ය සඳහා කර්මාන්ත ප්‍රවර්ධන පනත යටතේ මිල විමර්ශන කටයුතු සිදු කරන ලදී.


1995 වසර තුළදී ද සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව (සතොස) ප්‍රධාන ආහාර ද්‍රව්‍ය සහ අනෙකුත් පාරිභෝගික ද්‍රව්‍ය ආනයනය තොග වෙළෙඳාම සහ සිල්ලර වෙළෙඳාම යන කටයුතුවල නිරත විය. සතොස මගින් අඩුරන ලද ආහාර ද්‍රව්‍යවල අලෙවිය ව්‍යාප්ත කිරීම සඳහා 1995 දී දීප ව්‍යාප්ත වරලත් අලෙවිසැල් යෝජනා ක්‍රමයක් හඳුන්වා දුන් අතර, 1995 දෙසැම්බර් අවසන් වන විට එබඳු අලෙවිසැල් නියෝජිතයන් 8,892ක් පත් කරනු ලැබ තිබුණි. සතොස මගින් ගෙන්වනු ලබන ලොකු ළූණු, අර්තාපල් හා වියලි මිරිස් යන ආනයනයන්ගේ හා වෙළෙඳාමේ ලාභදායිකත්වය 1995 වසර තුළද පවත්වාගෙන ගිය නමුත්, පෞද්ගලික අංශයෙන් ඇති වූ තරගකාරීත්වය හේතුකොටගෙන ලොකු ළූණු ආනයන ප්‍රමාණයේ සතොස හිමිකරගත් කොටස සියයට 27 සිට සියයට 9 දක්වා අඩු වූ අතර, එහි අර්තාපල් ආනයන ප්‍රමාණයේ දායකත්වයද සියයට18 සිට සියයට 8 දක්වා 1994 සහ 1995 යන දෙවසර අතර පහත වැටුණි. පරිප්පු ආනයන ප්‍රමාණයෙහි සතොස දායකත්වය සියයට 35 සිට සියයට 42 දක්වා ඉහළ නැගුණි. 1995 වර්ෂයේ තිරිඟු ආනයනය සම්පූර්ණයෙන්ම කරන ලද්දේ සතොස මගිනි. 1994 අගෝස්තු මාසයේ හඳුන්වා දුන් තිරිඟු පිටි සහනාධාරය ක්‍රමයෙන් අඩු කළද, 1995 දෙසැම්බර් මස වන විට දේශීය තිරිඟු පිටි අලෙවිය සම්බන්ධයෙන් වූ සහනාධාරයේ ප්‍රමාණය තිරිඟු පිටි කිලෝවකට රුපියල් 4.95 ක්ව පැවතුනි[1].

වෙළෙඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ දෙපාර්තමේන්තුව විසින් කුඩා රබර් වතු හිමියන්ගෙන් ෂීට් රබර් මිලට ගැනීමේ කටයුතු තවදුරටත් කරගෙන යනු ලැබුවද දෙපාර්තමේන්තුව විසින් මිලට ගනු ලැබුවේ, කුඩා ප්‍රතිශතයක් පමණි. ජාත්‍යන්තර මිල ගණන් අනුව යමින්, ෂීට් රබර් සඳහා නිෂ්පාදකයන්ගේ මිල ගණන් දෙපාර්තමේන්තුව මගින් නිවේදනය කරනු ලබන අතර එය පෞද්ගලික වෙළෙඳුන්ට දර්ශක මිලක් ලෙස සලකා ක්‍රියා කරනු ලැබූ බැවින්, කුඩා වතු හිමියන්ට සිය රබර් සඳහා වාසිදායක මිලක් ලබාගැනීමට දෙපාර්තමේන්තුවේ මිලට ගැනීම් ආධාර විය. මීට අමතර වශයෙන් වෙළෙඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ දෙපාර්තමේන්තුව මගින් ෂීට් රබර් නිෂ්පාදනය සඳහා අවශ්‍ය රසායන ද්‍රව්‍ය බෙදා හැරීමේ කටයුතු වලද නොකඩවා නිරත විය.

1 සමූපකාර සමිති සඳහා වූ තිරිඟුපිටි තොග විකුණුම් මිල

## 9.13 සංචාරක ව්‍යාපාරය

1995 වර්ෂය අවසානයේදී සංචාරක ව්‍යාපාරය දැඩි පිරිහීමකට ලක් විය. 1995 අප්‍රේල් මස සිට ත්‍රස්තවාදී එදිරිවාදිකම් යළි ඇරඹීමෙන් පසුව පවා 1995 සැප්තැම්බර් දක්වාම සංචාරක පැමිණීම්වල සියයට 5 ක වර්ධනයක් දක්නට ලැබුණි. එසේ වුවද, එදිරිවාදිකම් වැඩි වීමත් සමඟම වසරේ අවසන් කාර්තුව තුළදී සංචාරක පැමිණීම් සියයට 17 කින් පහත වැටුණි. 1995 වර්ෂය සමස්ථයක් ලෙස ගත් කල සංචාරක පැමිණීම්වල පහත වැටීම සියයට 1 ක් විය. 1995 වර්ෂයේ සංචාරක ව්‍යාපාරයෙන්




ලත් දළ ඉපයුම් රුපියල් දශලක්ෂ 11,569 ක් දක්වා රුපියල් වටිනාකම අනුව සියයට 2 කින් ඉහළ ගිය අතර, විදේශ ව්‍යවහාර මුදල් වටිනාකම් අනුව විගැහි සියයට 7 කින් අඩුවිය.

1995 වර්ෂයෙහි දක්නට ලැබුණු විදේශීය පෞද්ගලික ආයෝජනවල පහත වැටීම පිළිබඳ දක්වමින්, ව්‍යාපාරික කටයුතු සඳහා පැමිණි සංචාරකයන් සංඛ්‍යාවෙහි කැපී පෙනෙන පහත වැටීමක් දක්නට ලැබුණි. සමස්ථ සංචාරක පැමිණීම්වල පහත වැටීමක් දක්නට ලැබුණද, එයාර් ලංකා ගුවන් සේවාවේ යානා ධාරිතාව වැඩිවීම නිසා "එයාර් ලංකා" ගුවන් යානා මගින් පැමිණි සංචාරකයන්ගේ සංඛ්‍යාව සියයට 3 කින් ඉහළ නැගුණි.

වර්ගීකරණය කරන ලද නවාතැන් අංශයේ වූ හෝටල් සංඛ්‍යාව 1995 වර්ෂයේද 134 ක්ව පැවතුණ අතර, කාමර උපයෝජනය 10,868 ක් දක්වා සුළු වශයෙන් වැඩි විය. වාර්ෂික උපයෝජන අනුපාත පිළිබඳ දත්තයන්ට අනුව, සංචාරක හෝටල් කර්මාන්තයේ ලාභදායිත්වය පහතහෙළමින්, 1994 වර්ෂයේ සියයට 56.6 ක් වූ වාර්ෂික හෝටල් උපයෝජන අනුපාතය, 1994 වර්ෂයේදී සියයට 53.1 දක්වා අඩු විය.

මේ අතර, සංචාරක පැමිණීම් සහ ඒ හා සම්බන්ධ ආර්ථික කටයුතුවල පසුගිය වර්ෂ කිහිපය තුළ දක්නට ලැබුණු වර්ධනය අනුව යමින් හෝටල් කර්මාන්තය වැනි සංචාරක ව්‍යාපාරය හා බැඳුණු අංශවල 1994 වසර තුල ඇරඹුනු ආයෝජන ව්‍යාපෘතීන් 1995 වසර තුළ ද ක්‍රියාත්මකව පැවතුණි.

### සංඛ්‍යා සටහන 9.11

## 1991-1995 සංචාරක ව්‍යාපාරය පිළිබඳ සංඛ්‍යා ලේඛණ.

| ශීර්ෂය | 1991 | 1992 | 1993 | 1994 | 1995 (අ) | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | 1994 | 1995 |
| 1. සංචාරක පැමිණීම් | 317,703 | 393,669 | 392,250 | 407,511 | 403,401 | 3.9 | -1.0 |
| 2. කලාප අනුව පැමිණීම් ගණන | | | | | | | |
| යුරෝපය | 198,413 | 256,485 | 257,883 | 261,045 | 254,730 | 1.2 | -2.4 |
| ප්‍රංශය | 35,279 | 40,206 | 34,770 | 30,510 | 30,996 | -12.3 | 1.6 |
| ජර්මනිය | 63,610 | 85,365 | 95,541 | 93,756 | 79,698 | -1.9 | -15.0 |
| ඉතාලිය | 23,312 | 25,539 | 18,210 | 18,066 | 18.378 | -0.8 | 1.7 |
| එක්සත් රාජධානිය | 31,585 | 41,238 | 44,226 | 50,313 | 63.582 | 13.8 | 26.4 |
| වෙනත් | 44,627 | 64,137 | 65,136 | 68,400 | 62,076 | 5.0 | -9.2 |
| උතුරු ඇමෙරිකාව | 11,519 | 12,954 | 13,743 | 15,612 | 14,565 | 13.6 | -6.7 |
| කැනඩාව | 3,462 | 4,065 | 4,044 | 4,920 | 5,469 | 21.7 | 11.2 |
| ඇමෙරිකානු එක්සත් ජනපදය | 8,057 | 8,889 | 9,699 | 10,692 | 9,096 | 10.2 | -14.9 |
| ආසියාව | 92,543 | 107,103 | 105,093 | 116,352 | 118,323 | 10.7 | 1.7 |
| ජපානය | 21,950 | 28,761 | 20,397 | 19,497 | 18,180 | -4.4 | -6.8 |
| ඉන්දියාව | 21,901 | 25,728 | 32,391 | 44,142 | 47,448 | 36.3 | 7.5 |
| පකිස්ථානය | 10,556 | 11,445 | 12,360 | 10,188 | 11,325 | -17.6 | 11.2 |
| හොංකොං | 6,374 | 1,527 | 2,775 | 4,302 | 7,194 | 55.0 | 67.2 |
| වෙනත් | 31,762 | 39,642 | 37,170 | 38,223 | 34,176 | 2.8 | -10.6 |
| ඕස්ට්‍රලේසියාව | 12,247 | 12,759 | 11,610 | 12,033 | 10,254 | 3.6 | -14.8 |
| ඕස්ට්‍රේලියාව | 11,241 | 10,980 | 10,413 | 9,681 | 9,066 | -7.0 | -6.4 |
| නවසීලන්තය | 943 | 1,131 | 1,077 | 1,323 | 1,104 | 22.8 | -16.6 |
| වෙනත් | 63 | 648 | 120 | 1,029 | 84 | 757.5 | -91.8 |
| වෙනත් කලාප | 2,981 | 4,368 | 3,921 | 2,469 | 5,529 | -37.0 | 123.9 |
| 3. පැමිනීමේ අරමුණ අනුව සංචාරකයින්ගේ ගණන | 317,703 | 393,669 | 392,250 | 407,511 | 403,101 | 3.9 | -1.1 |
| විනෝදය | 295,781 | 373,198 | 387,151 | 377,537 | 383,570 | -2.5 | 1.6 |
| ව්‍යාපාරක කටයුතු | 12,073 | 15,353 | 3,923 | 21,340 | 10,772 | 444.0 | -49.5 |
| වෙනත් | 9,849 | 5,118 | 1,177 | 8,634 | 8,759 | 633.6 | 1.4 |
| 4. සංචාරක දින (රාත්‍රි) ගණන (දහස්) | 3,633 | 4,055 | 4,148 | 4,250 | 4,051 | 2.5 | -4.7 |
| 5. පැය 24 ට අඩුකාලයකට රටතුල රැදෙන විදේශික මගින්ගේ පැමිණීම. | 2,665 | 5,651 | 6,093 | 8,413 | 10,556 | 38.1 | 25.5 |
| 6. දළ සංචාරක ලැබීම් (රුපියල් දශලක්ෂ) | 6,486 | 8,826 | 10,037 | 11,375 | 11,569 | 13.3 | 1.7 |
| 7. ඒකපුද්ගල සංචාරක වියදම | 20,415 | 22,420 | 25,588 | 27,913 | 28,396 | 9.1 | 1.7 |
| 8. මුළු සේවා නියුක්තිය | 64,507 | 69,096 | 73,704 | 84,154 | 87,360 | 14.2 | 3.8 |
| සෘජු | 26,878 | 28,790 | 30,710 | 35,064 | 36,260 | 14.2 | 3.4 |
| වක්‍ර | 37,629 | 40,306 | 42,994 | 49,090 | 51,100 | 14.2 | 4.1 |

මූලයයන් : ලංකා සංචාරක මණ්ඩලය
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික